

පළමු කාණ්ඩය - සයවැනි කලාපය

# ශ්‍රී ලංකාවේ මානව හිමිකම්


2013
ඔක්තෝබර්


**ආසියානු මානව හිමිකම් කොමිසමෙන් සතිපතා වීඩියෝ පුවත් සේවාවක් Human Rights Asia Weekly Roundup** 2





නඩුව ඇහැව්වොත් කැරළි ගහයි ද? **නඩුවට පෙරම කැකිල්ලේ තීන්දුව** 3

**ජාත්‍යාලය** 9




***රටේ ඇත්ත ඇතිසැටියෙන් දකින්න*** 10

හඬනු මැන දේශය කාව්‍ය සංග්‍රහය පිළිබඳ
බැසිල් ප්‍රනාන්දු සමග විශේෂ සම්මුඛ
සාකච්ඡාව



*සංස්කාරක සටහන*

**න ට ත් ර ජෙ ක් උ ම තු ම ති න්** 17

**උමතුව නිතරම බලය කැටුව එයි.** 18

**ශ්‍රී ලංකා පොලීසියට පරපීඩා කාමුකත්වය** ***ආචාර්ය සුනිල් කුරේ සමග ශ්‍රී ලංකාවේ පොලිස් වධ හිංසාව පිළිබඳ සම්මුඛ සාකච්ඡාවක්*** **19**

**ලංකාවේ විනිසුරුවරුන්ටත් 'ජජයිටිස්'** Judgeitis 25



**Narrtive of Justice in Sri Lanka -** ශ්‍රී ලංකාවේ **මානව බේදවාචකයේ කතාන්දරය**
පවසන ග්‍රන්ථයක් - එරාන් වික්‍රමරත්න 29

බරණැස් නුවර අබ මල් දුටිමි 33

**මනෝහරන්ගේ කතාව සහ ශ්‍රී ලංකාවේ විනිර්මුක්තියේ අර්බුදය** 38

**පියෙකුගේ කතාන්දරයක්** 40




සංස්කරණ උපදේශකත්වය - බැසිල් ප්‍රනාන්දු


*ආසියානු මානව හිමිකම් කොමිසම* කලාපීය වශයෙන් ක්‍රියාත්මක වන රාජ්‍ය නොවන සංවිධානයක් වන අතර ආසියාවේ මානව හිමිකම් සුරක්ෂණය සහ ප්‍රවර්ධනය කිරීම උදෙසා ඒවා අධීක්ෂණය, කඩවීම් ලේඛනගත කිරීම හා යුක්තිය සහ ආයතනයික ප්‍රතිසංස්කරණ සඳහා උපදේශන ලබාදීම සිදුකරයි. හොංකොං හි පිහිටා තිබෙන ආසියානු මානව හිමිකම් කොමිසම 1984 වසරේ පිහිටුවනු ලැබීය.




# ආසියානු මානව හිමිකම් කොමිසමෙන්
# සතිපතා වීඩියෝ පුවත් සේවාවක්
## Human Rights Asia Weekly Roundup

ආසියානු කලාපයේ මානව හිමිකම් ප්‍රවර්ධනය සහ සුරක්ෂණය සඳහා කටයුතු කරන ආසියානු මානව හිමිකම් කොමිසම (AHRC) ඔක්තෝබර් 14 වැනිදා සිට සිය සතිපතා වීඩියෝ පුවත් බුලටිනය සාඩම්බරයෙන් ඉදිරිපත් කරයි. මෙය, කලාපයේ වඩාත් ප්‍රමුඛතම මානව හිමිකම් ගැටලු සම්බන්ධයෙන් ආසියානු මානව හිමිකම් කොමිසමේ නවතම ප්‍රවේශයයි. සිවිල් සහ දේශපාලන අයිතිවාසිකම් මෙන්ම සමාජයීය සහ සංස්කෘතික අයිතිවාසිකම් ද මෙහිදී ආවරණය කෙරේ. කලාපයේ මානව හිමිකම් පිළිබඳ සංවාදය පුළුල් කිරීමට සහ එකී අයිතිවාසිකම් වැඩි දියුණු කර ගැනීම සඳහා සාමූහිකත්වය වැඩිදියුණු කර ගැනීමට ද මෙමගින් අපේක්ෂා කරයි.



http://www.youtube.com/watch?v=bjJ7lG_voDI හෝ යූ ටියුබ් වෙබ් අඩවියේ සර්ච් බොක්ස් හි Human Rights Asia Weekly Roundup යන්න ටයිප් කිරීම මගින් ඔබටද ඒ වෙත පහසුවෙන් පිවිසිය හැක.

මෙම පළමු දිගහැරුමේදී ඉන්දියාවේ දූෂණය, ඉන්දුනීසියාවේ හමුදා වධ හිංසාව ආදී පුළුල් පරාසයක මාතෘකා ආවරණය කරන අතර ශ්‍රී ලංකාවේ ක්‍රමයෙන් වැඩිවන ඒකාධිකාරීත්වය පිළිබඳ ආසියානු මානව හිමිකම් කොමිසමේ විධායක අධ්‍යක්ෂ, ශ්‍රී ලාංකේය නීතිඥ බැසිල් ප්‍රනාන්දු මහතා විශ්ලේෂණයක යෙදෙයි. ඔක්තෝබර් 21 වැනිදාතමින් යුත් දෙවැනි දිගහැරුමේදී පාකිස්ථානයේ රැකවරණ ස්ත්‍රී දූෂණ සහ ත්‍රස්තවිරෝධී නීති/ ඉන්දියාවේ අශෝභන අපරාධ යුක්තික ක්‍රමය සහ බංග්ලාදේශ මානව හිමිකම් ක්‍රියාකාරී අදිලූර් රහ්මන් ඛාන් අත්තනෝමතික රැඳවුමෙන් නිදහස් වීම පිළිබඳ විමසා බැලෙයි.

media@ahrc.asia වෙත මේ පිළිබඳ සිය අදහස් මෙන්ම ආසියානු කලාපයේ අවධානය යොමුවිය යුතු යැයි ඔබ සිතනා තොරතුරු ද දන්වා එවීමට ඔබටද පුළුවන.

# නඩුව ඇහැව්වොත් කැරළි ගහයි ද?

## නඩුවට පෙරම කැකිල්ලේ තීන්දුව




නඩුත් බඩුත් යන දෙකම රජ්ජුරුවන්ගේ වන රටක විනිසුරන් එක් එක් නඩුව ගැන හිතෙන හිතෙන දේ කීම පුදුමයක් නොවේ. අන්තර්ජාතික ලෙස මහත් ආන්දෝලනයක් ඇති කළ - වව්නියාව සිරගෙදරදී කැරැල්ලක් අතරතුර මියගියේ යැයි කියන ගනේෂන් නිමලරූබන් ගේ ඝාතනය පිළිබඳ මූලික අයිතිවාසිකම් පෙත්සම සලකා බැලීමට ඉඩ නොතබමින් විධායකය විසින් පත් කළ හෙවත් නිල

**නොවන අගවිනිසුරු නැවත වරක් කැකිල්ලේ රජ්ජුරුවන්ට ඇන්දේය. අයදුම්පත නිෂ්ප්‍රභා කළේය. පහත දැක්වෙන්නේ සිරකරු මරණයක් පිළිබඳ සලකාබැලීම නිසා සිරකරුවන් කැරළි ගසනු ඇතැයි ගනේෂන් නිමරූබන් නඩුවේදී ඩී ෆැක්ටෝ අගවිනිසුරු කියයි යනුවෙන් ආසියානු මානව හිමිකම් කොමිසම ඒ පිළිබඳ අදහස් දක්වා සිටි ආකාරයයි.**

පසුගිය වසරේදී දේශීය සහ අන්තර්ජාතික වශයෙන් සැලකිල්ලට ලක්වූ - බන්ධනාගාරයේදී මියගිය දමිල සිරකරු ගනේෂන් නිමලරූබන්ගේ නඩුව, ඔක්තෝබර් 14 වැනිදා ශ්‍රේෂ්ඨාධිකරණය ඉදිරියට ගෙන ආ අතර එහිදී ඩී ෆැක්ටෝ හෙවත් තත්වාකාර අගවිනිසුරු මොහාන් පීරිස්, එම මූලික අයිතිවාසිකම් නඩුව සලකා බැලීම ප්‍රතික්ෂේප කළේය. මූලික අයිතිවාසිකම්වලදී එකී අයදුම්පත් සලකා බැලීම සඳහා අවසර ලබාදීම සම්බන්ධයෙන් වන සාමාන්‍ය ප්‍රමිතීන් හා කාර්යපටිපාටිය අනුගමනය කිරීම සහ නියෝගයක් ලබාදීමට පෙර සලකා බැලිය යුතු ගැටලු සලකා බැලීම ඩී ෆැක්ටෝ අගවිනිසුරු විසින් ප්‍රතික්ෂේප කළේය. එකී ප්‍රමිතීන් සහ කාර්යපටිපාටීන් පහත දැක්වෙන පරිදි වේ.

1. පෙත්සම්කරු විසින් ගොනුකළ අයදුම්පතෙන් ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාව විසින් පිළිගෙන තිබෙන මූලික අයිතිවාසිකම් අතරින් යම්කිසි අයිතිවාසිකමක් උල්ලංඝනය වූ බව පෙනී යන්නේද,

2. සිද්ධිය පිළිබඳ පරීක්ෂණයක් පැවැත්වීම සාධාරණීකරණය කරන සුදුසු සාක්ෂි අධිකරණය ඉදිරියේ තබා ඇති බව වාර්තාව මතුපිටින් පෙනෙන්නට තිබේද,

3. අයදුම්පතක් ගොනු කළ යුතු කාලසීමාව වැනි කාර්යපටිපාටික අවශ්‍යතා සමග එකී අයදුම්පත අනුකූල වන්නේද යන්න.

මේ ප්‍රතිෂ්ඨාවන් මත පදනම් වූ විට ගනේෂන් නිමලරූබන් වෙනුවෙන් ගොනුකළ මූලික අයිතිවාසිකම් අයදුම්පත, පෙත්සම්කරු විසින් නගන චෝදනාව වන සිය පුත්‍රයාගේ මරණය සිදුවූයේ වගඋත්තරකාර නිලධාරීන් විසින් සිදුකළ තුවාළ හේතුවෙනි යන්න එකී අවශ්‍යතා සමග අනුකූල වේ. ඩී ෆැක්ටෝ අගවිනිසුරු පවා මරණය ආශ්‍රිත කරුණු සම්බන්ධයෙන් එකඟතාව පළකළ අතර අයදුම්පතේ ද දෝෂයන් නොවිණ.


සෑම නඩුවකදීම විනිසුරුවරුන් ඔවුන් ඉදිරියේ තැබූ සාක්ෂි මත පදනම් ව කටයුතු කරනු ඇතැයි ද සිය පක්ෂපාතීභාවයන්, ප්‍රාග් විනිශ්චයන් සහ පුද්ගලානුභූතීන්ගෙන් එකී නඩුවලට තීන්දු ලබාදීමේදී බලපෑමක් සිදුනොකරනු ඇතැයි ද අපේක්ෂා කෙරේ. පළ වී ඇති වාර්තාවන් ට අනුව ඩී ෆැක්ටෝ අගවිනිසුරුවරයා මෙකී අතිශය මූලික මූලධර්මය අවඥාවෙන් සලකා තිබේ. මේ ප්‍රශ්නය අවසන් කළ යුතු බවත්, නීතීඥවරුන් ට ද රට කෙරෙහි වගකීමක් තිබෙන බවත්, වරදකාර බන්ධනාගාර නිලධාරීන් ට එරෙහිව මෙවැනි අයදුම්පත් ඉදිරිපත් කිරීම නිසා තව තවත් රැඳවියන් සිරගෙදර කැරළි ගැසීමට ඉඩ ඇති බවත් මේ අනුව මෙයින් වැරදි පණිවුඩයක් යන බවත් ඔහු නඩුව පටන් ගන්නා විට ම කියා තිබේ.

රටේ වගකීම, නීතීඥවරුන්ගේ රාජකාරිය මෙන්ම අධිකරණයේ ද රාජකාරිය වන්නේ නීතිය උත්තම්භනය කිරීමයි. අධිකරණය එසේ කිරීමට අපොහොසත් වන්නේ නම් නීතිය උත්තම්භනය කිරීමට වෙන කිසිවෙක් නැත. නීතිය එසේ උත්තම්භනය නොකිරීම, රට ට අවුල් ජාලයක් වන්නට ඉඩහැරීමකි. ඩී ෆැක්ටෝ අගවිනිසුරුවරයාගේ රාජකාරිය වන්නේ සිය නිලය හේතුවෙන් තමන් වෙත නියම වී තිබෙන වගකීම් නැවත මෙනෙහි කිරීම මිස තමන්ට තිබිය හැකි පරමාදර්ශයන් සහ පක්ෂපාතීකම් පිළිබඳ දෙසීම නොවේ. විනිසුරුවරයෙකු ම තමන්ගේ වගකීම්වලට ගරු කිරීමට අසමත් වන විට ඔහුට/ඇයට නීතීඥවරුන්ගේ වගකීම් ගැන කතා කිරීමට තිබෙන අයිතිය කුමක්ද? ඇත්ත වශයෙන්ම, පෙත්සම්කරු වෙනුවෙන් මූලික අයිතිවාසිකම් අයදුම්පත් ඉදිරිපත් කිරීමෙන් සහ ඒ අනුව පහළ හෝ සමාජයීය වශයෙන් නොසලකා හැර තිබෙන ඕනෑම

අයෙකුගේ අයිතිවාසිකම් ආරක්ෂා කිරීම සඳහා නැගී සිටින බව විදහා දැක්වීම මගින් නීතීඥවරුන් තමන්ගේ වගකීම ඉටුකර තිබේ.



ගනේෂන් නිමලරූබන්
Photo Courtesy :BBC


H 033584 – 30,000 (2009/09) P
ශ්‍රී ලංකා පොලීසිය
SRI LANKA POLICE
පණිවුඩ පෝරමය
MESSAGE FORM
පොලිස් POLICE 263*

| දිනය Date | 2012.07.06 | ලැබුණු වේලාව Time of Receipt | 06.45 | From Station | To Station |
|---|---|---|---|---|---|
| පවතු ලබන ක්‍රියා කරවන්නා Sending Operator | | බාරගනු ලබන ක්‍රියා කරවන්නා Receiving Operator | | ස්ථානයෙන් | ස්ථානය වෙත |

From ... ගෙන | To ... වෙත | අංකය No 61

2012 07.19

බෙදා හැරීම Distribution

Photo Courtesy : www.thinakkathir.com

අගවිනිසුරුවරයා මෙහිදී ගෙන ඇති ප්‍රවේශය, සෙසු නිලධාරීන් ට ද නීතියට එරෙහිව කටයුතු කිරීමට සහ මේ නඩුවේදී සිදුවූ ආකාරයට සිරකරුවන්ට මරණයට පත් කිරීම ද ඇතුළත්ව ඔවුන් ට ප්‍රශ්න ඇති කිරීම දිරිමත් කරනු ඇත. තමන්ට එරෙහි පැමිණිලි දෙස බැලීමට අධිකරණය අකමැති බව නිලධාරීන් දන්නා විට සිය බලය අපහරණය කිරීමෙන් ඔවුන්ව වළක්වාලන කිසිවක් නොවේ.

"ළමයින් ව හොඳට හැදුව නම් මේ වගේ දේවල් වෙන්නෙ නෑ" යැයි ඩී ෆැක්ටෝ අගවිනිසුරුවරයා පැවසූ බව වාර්තා වේ. මෙය පැහැදිලිවම, ඒ වන විට අසා නැති නඩුවක් සම්බන්ධයෙන් පූර්ව විනිශ්චයක් සහ අගතියකි. මේ හා සමාන ප්‍රකාශ ඕනෑම අයෙකුට සිදුකළ හැක. උදාහරණයක් වශයෙන්, විනිසුරුවරුන් මැනවින් පුහුණු කළා නම් ඔවුන් ඉහතින් සඳහන් කළ ආකාරයේ ප්‍රකාශ සිදුනොකරනු ඇත. මේ සියල්ලේ ප්‍රතිඵලය වන්නේ අධිකරණ ක්‍රමවේදයන් හැල්ලුවට ලක් කර ඒවා යම්කිසි ආකාරයක දේශපාලන සෙල්ලමක් දක්වා ඌනනය කිරීමයි.

කැරැල්ල මැඩ පවත්වා, ප්‍රාණ ඇපකරුවන් බවට පත්ව සිටි බන්ධනාගාර නිලධාරීන් මුදා ගැනීම පිණිස බන්ධනාගාර අධිකාරීන් යම්කිසි ආකාරයක බලයක් යෙදවිය යුතුව තිබුණේ යැයි ද ඩී ෆැක්ටෝ අගවිනිසුරුවරයා කී බව වාර්තාවේ තවදුරටත් සඳහන් ය. ඉන්පසු ඔහු නැවත නැවතත් කියා ඇත්තේ නිමලරූබන් මහතා ඒ වන විටත් හෘද රෝගියෙකු බවත්, ඔහුගේ මරණය සිදුවූයේ එයින් බවත් ය. මේ අවස්ථාවේදී, මරණය සඳහා හේතු දෙකක් තිබූ බවත් එක හේතුවක් වන්නේ සෘජු බලහත්කාරය නිසා ඇතිවූ භ්‍රාන්තිය බවත් පෙත්සම්කරුගේ නීතීඥ පීරිස් මහතා පෙන්වා දී ඇත.


**මෙය පැහැදිලිවම, ඒ වන විට අසා නැති නඩුවක් සම්බන්ධයෙන් පූර්ව විනිශ්චයක් සහ අගතියකි. මේ හා සමාන ප්‍රකාශ ඕනෑම අයෙකුට සිදුකළ හැක. උදාහරණයක් වශයෙන්, විනිසුරුවරුන් මැනවින් පුහුණු කළා නම් ඔවුන් ඉහතින් සඳහන් කළ ආකාරයේ ප්‍රකාශ සිදුනොකරන ඇත.**

## පුද්ගලික දැනුම

නඩුවේ මේ අවස්ථාව වන විට පාර්ශවයන් දෙක විසින් අධිකරණය හමුවේ සියලු සාක්ෂි ඉදිරිපත් කරන නොතිබුණු අතර කරුණු මත පිහිටා සිය තීන්දුව ලබාදීමේ තත්වයක ඩී ෆැක්ටෝ අගවිනිසුරු සිටියේ නැත. කලම්බෝ ටෙලිග්‍රාෆ් හි පළවූ පහත සඳහන් වාර්තාව, ඔහුගේ එම තීන්දුව ලබාදී තිබෙන්නේ පුද්ගලික දැනුම මත බවට හඟවා සිටියි.

**"කැරැල්ල සමග වින්දිතයාගේ සම්බන්ධය තහවුරු කරන කිසිවක් අධිකරණය ඉදිරියේ නැතැයි පෙත්සම්කරුගේ නීතීඥයා පෙන්වා දුන් අවස්ථාවේදී ඩී ෆැක්ටෝ අගවිනිසුරු පීරිස් දක්වා ඇත්තේ සිද්ධි සම්බන්ධයෙන් තමන් පුද්ගලිකවම දැන සිටි බවයි."**

ප්‍රගීත් එක්නැලිගොඩ බටහිර රටක ජීවත් වන බව තමන් පුද්ගලිකව දන්නේ යැයි එක්සත් ජාතීගේ වධහිංසාවට එරෙහි කමිටුවට පැවසුවේ ද මේ මොහාන් පීරිස් ම ය. පසුව අධිකරණය ඉදිරියේ එය සහතික කිරීමට අවශ්‍ය වූ විට ඔහු කියා සිටියේ, එම පුද්ගලික දැනුම යම් කෙනෙක් ඔහු සමග කියූ දෙයක් මත පදනම් වූ බවත් එය තමන්ට කීවේ කවුදැයි මතකයක් නැති බවත් ය. ප්‍රගීත් එක්නැලිගොඩ සිටින්නේ කොහේදැයි දන්නේ දෙවියන් වහන්සේ පමණක් යැයි ද ඔහු අධිකරණයට පැවසුවේය.



***ප්‍රගීත් එක්නැලිගොඩ බටහිර රටක ජීවත් වන බව තමන් පුද්ගලිකව දන්නේ යැයි එක්සත් ජාතීගේ වධහිංසාවට එරෙහි කමිටුවට පැවසුවේ ද මේ මොහාන් පීරිස් ම ය. පසුව අධිකරණය ඉදිරියේ එය සහතික කිරීමට අවශ්‍ය වූ විට ඔහු කියා සිටියේ, එම පුද්ගලික දැනුම යම් කෙනෙක් ඔහු සමග කියූ දෙයක් මත පදනම් වූ බවත් එය තමන්ට කීවේ කවුදැයි මතකයක් නැති බවත් ය. ප්‍රගීත් එක්නැලිගොඩ සිටින්නේ කොහේදැයි දන්නේ දෙවියන් වහන්සේ පමණක් යැයි ද ඔහු අධිකරණයට පැවසුවේය.***

පුද්ගලික දැනුම පිළිබඳ මේ සඳහන ගැටලු ගණනාවක් මතු කරයි. පුද්ගලික දැනුම යන්නෙන් අදහස් කරන්නේ කුමක්ද? නිමලරූබන්ගේ මරණයට හේතු වූ සිද්ධි සම්බන්ධයෙන් ඔහුට යම්කිසිවක් දැක හෝ අසා තිබේද නැතිනම් යම්කිසි ආකාරයක ඓන්ද්‍රීය දැනුමක් තිබුණේද? එසේත් නැතිනම් ඔහු එම දැනුම ලබාගත්තේ වගඋත්තරකාර පොලිස් නිලධාරීන් ඔහුට කී දෙයකින්ද? නොඑසේ නම් පෙත්සම්කරුට නොපෙන්වන යම්කිසි ලියවිල්ලකින් ද? පිළිතුර කුමක් වුවත් එයින් ඩී ෆැක්ටෝ අගවිනිසුරු සහ ශ්‍රේෂ්ඨාධිකරණයේ ද වරද තහවුරු කරන්නකි.

තමන් විසින් අසන්නට යන නඩුවක් සම්බන්ධයෙන් තමන්ට පුද්ගලික දැනුමක් තිබෙන බව විනිසුරුවරයෙක් පවසයි නම් කළහැකි එකම දෙය තමන් එම නඩුව ඇසීමෙන් ඉවත් වීමයි. එසේ නොකිරීම, අපේක්ෂිත අධිකරණමය කල්ක්‍රියාවේ මූලික අංගයන් හෙළා දැකීමකි.

"

**තමන් විසින් අසන්නට යන නඩුවක් සම්බන්ධයෙන් තමන්ට පුද්ගලික දැනුමක් තිබෙන බව විනිසුරුවරයෙක් පවසයි නම් කළහැකි එකම දෙය තමන් එම නඩුව ඇසීමෙන් ඉවත් වීමයි.**

"

තවද ඩී ෆැක්ටෝ අගවිනිසුරු රජයේ නීතිඥයෙක් වශයෙන් සිය පුද්ගලික අත්දැකීම් පිළිබඳ කතාන්දර ද, ඇමරිකා එක්සත් ජනපදයේ සිද්ධීන් පිළිබඳ කතාන්දර ද කියූ බව වාර්තා වන අතර ඒවා ඔහුට බැර නොවේ. මොහාන් පීරිස් සිය පෞද්ගලික අත්දැකීම් ගැන කතා කරන්නට පටන් ගනියි නම් තවත් බොහෝ අයට මොහාන් පීරිස් සමග ඔවුන්ගේ අත්දැකීම් ද සඳහන් කිරීමට උවමනා වනු ඇත. කෙසේ නමුත්, අධිකරණයෙන් පිටත සිදුවූ ඝාතනයක් සම්බන්ධ චෝදනාවක් සමග ඔහුගේ මේ විකාරවලට තිබෙන්නේ කුමන අදාළත්වයක් ද?

පෙත්සම්කරුගේ සිරුරේ, අතක් බිඳී යාම ඇතුළුව තුවාළ 20 කට වඩා තිබූ බවත් මේ තුවාළ කැරැල්ල මැඩපවත්වන අවස්ථාවේ සිදුවූයේ යැයි සාක්ෂි නොමැති බවත් පෙත්සම්කරුගේ නීතිඥවරයා අධිකරණයේදී සඳහන් කළේය. ඩී ෆැක්ටෝ අගවිනිසුරු එක්කෝ හිතලුවක එල්බගෙන සිටින්නට ඇත. එසේත් නැතිනම් පෙත්සම නිෂ්ප්‍රභා කිරීමේදී තමන් සද්භාවයෙන් ක්‍රියාකරන බව පෙන්වීමට හිතාමතාම නිර්මාණය කර ගත් කතාන්දරයක එල්බගෙන සිටින්නට ඇත.

තවද, අධිකරණයට ලබාදුන් විශ්වාසනීය ලියකියවිලි, පෙත්සම්කරුට ලෝකය වටා බෙදාහැරිය හැකි නිසා ඒ ලියකියවිලි ඔහුට ලබාදිය නොහැකි යැයි අගවිනිසුරුවරයා සඳහන් කර තිබෙන බව ද තවදුරටත් වාර්තා වෙයි. පරීක්ෂණයකදී විවෘත අධිකරණයක් ඉදිරියේ සියල්ල තැබිය යුතු බවටත් සියලු පාර්ශවයන් ට සියලු සාක්ෂි දැකීමට හිමිකම ලබන බවටත් තිබෙන සාක්ෂි පිළිබඳ සරල අවිවාදිතයකි. අධිකරණය ඉදිරියේ තබා ඇත්තේ මොනවාදැයි දැනගැනීම මහජනයාගේ අයිතියයි. සාධාරණත්වය තාර්කික ක්‍රියාවලියක් මිස විනිසුරුවරයෙකුගේ දේව ගතියක් නොවන අතර විනිසුරුවරයෙකු සිය තීරණය වෙත එළඹුණු ක්‍රියාවලිය කුමක්දැයි දැනගැනීමට මහජනයාට අයිතියක් ඇත.

ගනේෂන් නිමලරූබන්ගේ පෙත්සම නිෂ්ප්‍රභා කිරීම එකලාම වැරදි බවත් එය, පියෙකු වශයෙන් පෙත්සම්කරුගේ අයිතිවාසිකම් පැහැදිලි ලෙසම ප්‍රතික්ෂේප කිරීමක් බවත් ආසියානු මානව හිමිකම් කොමිසම එකහෙළා ප්‍රකාශ කර සිටියි. තවද එය සමස්තයක් වශයෙන් පුරවැසියන්ගේ අයිතිවාසිකම් ද ප්‍රතික්ෂේප කිරීමක් වන්නේ, අධිකරණ පරීක්ෂණයක මෙයාකාර මෙහෙයවීමක්, අධිකරණයක් ඉදිරියට එන සෑම අනාගත නඩුවක් සඳහා ම විපත්තිකාරී වන පූර්වාදර්ශයක් වන හෙයිනි.

## පෙත්සම්කරුට සහ ජනතාවට ගත හැකි ක්‍රියාමාර්ග මොනවාද?

තවද, අධිකරණයට ලබාදුන් විශ්වාසනීය ලියකියවිලි, පෙත්සම්කරුට ලෝකය වටා බෙදාහැරිය හැකි නිසා ඒ ලියකියවිලි ඔහුට ලබාදිය නොහැකි යැයි අගවිනිසුරුවරයා සඳහන් කර තිබෙන බව ද තවදුරටත් වාර්තා වෙයි.

පරීක්ෂණයකදී විවෘත අධිකරණයක් ඉදිරියේ සියල්ල තැබිය යුතු බවටත් සියලු පාර්ශවයන් ට සියලු සාක්ෂි දැකීමට හිමිකම ලබන බවටත් තිබෙන සාක්ෂි පිළිබඳ සරල අවිවාදිතයකි.

අධිකරණය ඉදිරියේ තබා ඇත්තේ මොනවාදැයි දැනගැනීම මහජනයාගේ අයිතියයි. සාධාරණත්වය තාර්කික ක්‍රියාවලියක් මිස විනිසුරුවරයෙකුගේ දේව ගතියක් නොවන අතර විනිසුරුවරයෙකු සිය තීරණය වෙත එළඹුණු ක්‍රියාවලිය කුමක්දැයි දැනගැනීමට මහජනයාට අයිතියක් ඇත.

- ආසියානු මානව හිමිකම් කොමිසම (AHRC)

මූලික මහජන වැදගත්කමකින් යුතු පහත දැක්වෙන වැදගත් නීති ගැටලු පැහැදිලි කර ගැනීම සඳහා, දෝෂාභියෝගය සම්බන්ධ අභියාචනාධිකරණ නඩු තීන්දුව ඉවත් කර ගන්නා ලෙස නීතිපතිවරයා විසින් ගොනු කළ පෙත්සම සලකා බැලීමට ලබාදුන් පූර්වාදර්ශය අනුව යමින් ශ්‍රේෂ්ඨාධිකරණයේ විනිසුරුවරුන් වැඩි සංඛ්‍යාවක් සිටින විනිශ්චයාසනයකට අභියාචනය කිරීමට පෙත්සම්කරුට ද අයිතිය තිබේ.

අ) මූලික අයිතිවාසිකම් සම්බන්ධ නඩුවකදී සහනය ලබාදුනහොත් සෙස්සන් ද එයින් සිය අයිතිය ඉල්ලා සිටීමට ඉඩ ඇත යන පදනම මත එවැනි නඩුවක් නිෂ්ප්‍රභා කළ හැකිද?

ආ) බන්ධනාගාර භාරයේ සිටි සිරකරුවෙකුගේ මරණය නීති අධිකරණයකදී අභියෝගයට ලක් කළහොත් එයින් සෙසු සිරකරුවන් බන්ධනාගාර අධිකාරීන්ට එරෙහිව උද්ඝෝෂණය කිරීමට දිරිමත් විය හැකි බැවින් බන්ධනාගාරයකදී සිදුවූ කිසිදු සිරකරු මරණයක් අභියෝගයට ලක්නොකළ යුතු බව පිළිගත් නීතියද?

ඇ) විනිසුරුවරයෙකුට සිය පුද්ගලික දැනීම මත නඩුවක තීන්දුවක් දිය හැකිය යන්න පිළිගත් නීතියද?

ඈ) අධිකරණයට පෙන්වූ ලියකියවිලි කිසිම පදනමක් මත, විශේෂයෙන්ම නඩුවේ යම්කිසි පාර්ශවයක් එබඳු යම්කිසි තොරතුරක් මහජනයා හට හෙළිකරාවි යන පදනම මතනඩුවේ පාර්ශවයන්ට නොපෙන්විය යුතුය යන්න පිළිගත් නීතියද?

ඉ) සිය පුද්ගලික ප්‍රාග් විනිශ්චයන් සහ පුද්ගලානුභූතීන් මත රැඳී විනිසුරුවරයෙකු ට නඩුවක තීන්දුව ලබාදීම සහ පාර්ශවයන්ට වැදගැම්මකට නැති උපදෙස් ලබාදීම දැන් පිළිගත් නීතියද?

ඊ) අපේක්ෂිත අධිකරණමය හැසිරීමට විනිසුරුවරයෙක් විවෘතව ගර්හා කරන විට පෙත්සම්කරුවෙකු හට තිබෙන ප්‍රතිකර්ම මොනවාද?

එ) ආණ්ඩුවට හෝ එහි කිසියම් නිලධාරියෙකු ට එරෙහිව නඩු ගොනු කිරීම රටේ සුබසෙතට එරෙහි වීමක් යන්න පිළිගත් නීතියද?

ඒ) ආණ්ඩුව හෝ එහි කිසියම් නිලධාරියෙකු විසින් ස්වකීය අයිතිවාසිකම් උල්ලංඝනය කර ඇතැයි පැමිණිලි කරන සිය සේවාදායකයන්ගේ උපදෙස් මත පදනම්ව නඩු ගොනු නොකිරීමට නීතීඥවරුන් ට බැඳියාවක් තිබේද?

මෙකී සහ නීතියේ සෙසු ප්‍රශ්නවලින් සමන්විත දීර්ඝ ලැයිස්තුව අභියාචනයක මාර්ගයෙන් සහ ඇපෑල තීන්දුවකට එරෙහිව අභියාචනය කිරීම සඳහා ශ්‍රේෂ්ඨාධිකරණය විසින් නීතිපතිවරයාට අවසර දීමෙන් ලබාදුන් පූර්වාදර්ශය මත පදනම්ව අධිකරණය ඉදිරියේ නැගිය හැකි වේ. එබඳු ගැටලු තමන් ඉදිරියේ සලකාබැලීමට ඉඩ දෙමින් ශ්‍රේෂ්ඨාධිකරණය පූර්වාදර්ශයක් ලබාදී තිබේ.

මේ නඩුවේදී ප්‍රත්‍යක්ෂ වූ සහ ශ්‍රේෂ්ඨාධිකරණයේ සාමාන්‍ය තත්වයක් බවට දැන් පත්වෙමින් තිබෙන මේ නින්දිත තත්වය කෙරෙහි අවධානය යොමු කර එය නතර කිරීම සඳහා මැදිහත් වන ලෙස ආසියානු මානව හිමිකම් කොමිසම නීතීඥ සංගමයෙන් සහ මහ ජනතාවගෙන් ඉල්ලා සිටියි.



# ජාත්‍යාලය

ශීතල රුධිරයැති ගණන් බැලීම තුළ
විහඟෙක් ගයයි කෙළෙහි ගුණ ගීතය
බිම වෙත තනන
ඒ සා මිහිරි පණුවන්.



දේශපාලකයෝ ද එසේම ය
ඔවුහු ද මව්බිම පසසති
තමන්ට බලයේ රැඳෙන්නට
ඉඩ දෙන මෝඩයන් තනන.

අසල්වාසීන් ට ආදරය කරන
සුරඟන කතාවන් වැනි
මිහිරි යුගයන් හිදී
විනිසුරෝ සුරැකූහ පුරවැසියන් ව.
අම්මාවරු වැදගත්වීය සෙස්සන් පරයා.
මිතුරෝ වූහ
කුඩා කොල්ලෝ ද කුඩා බල්ලෝ ද පුංචි කෙල්ලෝ ද දෙව්ලියෝ ද.

මේ සියල්ල කඩිමුඩියේ
දිව ආවේය මගේ මතකයට.

**- 'හඬනු මැන දේශය' බැසිල් ප්‍රනාන්දු කාව්‍ය සංග්‍රහයෙන්**






# රටේ ඇත්ත ඇතිසැටියෙන් දකින්න

බැසිල් ප්‍රනාන්දු අන්තර්ජාතික කීර්තියට පත් නීති විශාරදයෙකි. එසේම කවියෙකි. ඔහුගේ කාව්‍යයන් ආසියානු සහ බටහිර භාෂාවන් ගණනාවකට නැගී තිබේ. සුන්දර මෛත්‍රී යනුවෙන් ඔහුගේ කාව්‍ය සංග්‍රහයක් මලයාලම් බසට ද නැගුණේය. ඔහු විසින් ඉංග්‍රීසි බසින් ලියන ලද කාව්‍ය හැත්තෑ දෙකක එකතුවක් පසුගියදා ‘හඬනු මැන දේශය’ නමින් සිංහලයට නැගුණේය.  සාහිත්‍යය, වැදගත් නූතන සමාජයීය හා මානුෂ ප්‍රශ්න පිළිබඳ කථිකාවතක් විය හැක. මේ සම්මුඛ සාකච්ඡාවේදී බැසිල් ප්‍රනාන්දු විසින් රචනා කර සිංහලයට පරිවර්තන කරනු ලැබූ නවතම කාව්‍ය සංග්‍රහය පිළිබඳ නිලන්ත ඉලංගමුව, බැසිල් ප්‍රනාන්දු සමග සාකච්ඡා කරයි. එහිදී හිංසණය, ප්‍රචණ්ඩත්වය, පුද්ගලයාට හා සමාජයට එයින් සිදුවන බලපෑම පිළිබඳ මෙන්ම ප්‍රේමය හා ලිංගිකත්වය පිළිබඳ කතා කිරීමට ශ්‍රී ලාංකේය සන්දර්භය තුළ පවතින බාධාවන් පිළිබඳ ද බැසිල් විසින් රචනා කරන ලද නිදහස් කාව්‍යයන් පිළිබඳ විමසා බැලෙයි. එම යූ ටියුබ් සම්මුඛ සාකච්ඡාව ට http://www.youtube.com/watch?v=DObGZM_cH8U ඔස්සේ ඔබටද පිවිසිය හැකිය.

**නිලන්ත** - පසුගියදා හඬනු මැන දේශය නමින් බැසිල් ප්‍රනාන්දුගේ නවතම කාව්‍ය සංග්‍රහය මුද්‍රණය කර ප්‍රසිද්ධ කරනු ලැබුවා. එහි අඩංගු වන්නේ බැසිල් ප්‍රනාන්දු කවියා විසින් මුලින් ඉංග්‍රීසියෙන් ලියන ලද කවි පන්ති 72 ක සිංහල පරිවර්තනයන්. එම කවි පන්ති සිංහලයට නගා ඇත්තේ රදිකා ගුණරත්න විසින්. මෙම කවි 1970 පමණ සිට මේ දක්වා ලියා ඇති කවි පන්තිවලින් තෝරාගන්නා ලද කාව්‍යයන්. ඉංග්‍රීසි භාෂාවෙන් පළ කළ කවි ලංකාවේ මෙන්ම ලෝකයේ වෙනත් රටවල ද කාව්‍ය සංග්‍රහයන් හි නැවත නැවතත් පළ වී තිබෙනවා. අද අපි බැසිල් ප්‍රනාන්දු මහතා පිළිබඳ මේ සම්බන්ධයෙන් වැඩිදුර සාකච්ඡා කිරීමට බලාපොරොත්තු වෙනවා.

පළමුවෙන්ම මා යොමුවන්නට කැමතියි, ඔබේ කවි සම්බන්ධයෙන් ඉන්දියාවේ ප්‍රකට මහාචාර්යවරයෙකු මෙන්ම කවියෙකු ද වන කේ.ජී. සංකරපිල්ලේ විසින් ලියන ලද දීර්ඝ ලිපියක කොටසක් වෙත. එහි මෙසේ සඳහන් වෙනවා. *"...බැසිල්ගේ කවිකමෙහි එන ශ්‍රී ලංකාව, මුහුදු සුළං විසින් ගුප්ත ප්‍රාග් ඓතිහාසික සිවුරුහම් නද නගන මිත්‍යා දිවයිනක් හෝ විදේශීය ආක්‍රමණියන් විසින් කොල්ල කා වධ හිංසා පමුණුවන ලද යටත් විජිතවාදී ලංකාවක් නොවේ. එය ඔහුගේ මනසේ ඇති ගැඹුරු තුවාළයකි. එය ඔහුගේ නිර්භය නිර්මාණශීලීත්වය විසින් දකිනා, ආශ්වාස කරනා, නැවත සිහිකරනා, විරෝධය පානා සහ ගායනා කරනා, පළුදු සහිත නමුත් සිත අළවාගන්නා මරකත මැණිකකි... බැසිල් ප්‍රනාන්දු අයත් වන්නේ කවීන්ගේ වෙනත් මාදිලියකට ය. බැසිල් කතාන්දර කීමෙන් සොම්නසට පත්වන්නෙකි. මෙකී කතාන්දර තුළින් ඔහු අපගේ ගොරතර සමයන් හි උභතෝකෝටිකයන් මුදා හරියි. කවියේ මෙහෙවර ජාතිය විස්තර කිරීම, යථාර්ථය විස්තර කිරීම සහ දුගීම ජන බහුතරයේ ජාතිය විස්තර කිරීම බව බැසිල් සිතයි. සිය දේශය පෙළන, සෑම දේශයක්ම පෙළන වේදනාව සහ අවිද්‍යාව ප්‍රකාශ කිරීමේ මගක් බැසිල් සිය කවි තුළින් සොයයි. බැසිල්ගේ කවි විසින් ආශ්වාස කරනුයේ යුක්තියයි. එහි දූරදර්ශනයේ ආත්මය, එහි ඓතිහාසික බලකිරීමෙහි හඬ සහ එහි අධ්‍යාත්මික ශක්තියේ හරය යුක්තියයි. යුක්තිය පිළිබඳ නව ප්‍රජාතාන්ත්‍රික දැක්මක් සහිත යුක්තියේ කවියාගේ හඬ, සැබෑ සමාජ අත්දැකීම්වල විසල් අවකාශයෙන් පිරී යයි. විසිවන සියවසේ දේශපාලන කවීත්වයේ හෘදයාංගම මූලයන් එම කවි කමට තිබේ..."* මේ තක්සේරුව ගැන ඔබට තිබෙන්නේ මොන වගේ අහසක්ද?

**බැසිල් ප්‍රනාන්දු** - එහි ඉතා වටිනා අදහස් දෙක තුනක් කියැවෙනවා එයින් එක දෙයක් තමයි, අපේම කතා තුළින්, ඒ කියන්නේ රටේ ජීවත් වන කාගේත් කතා තුළින්- එදිනෙදා සිදුවන දේවල් තුළින් අපිට අපේ රට මොකක්ද, අප මුහුණ දෙන ගැඹුරුම ප්‍රශ්න මොනවාද යන්න පමණක් නොවෙයි, ජාත්‍යන්තරව විශාල වශයෙන් වෙනස්වෙමින් පවතින හා අන්තර් සම්බන්ධ වෙමින් පවතින ලෝකය සමග අප ගැටෙන විට ඒ තුළ කියැවෙන මනුෂ්‍ය කතාව මොකක්ද යන්න විස්තර කරන්නට කවිය විශාල වශයෙන් ආධාර කරගන්න පුළුවන්.

අතීතයේ අපේ පුරුද්දක් තිබුණා, එක්කො අපේ කවිවල කියැවෙන්න ඕනෙ අතීතය ගැන. රජ කාලය ගැන, අතීත වික්‍රමයන් ගැන වැනි දේවල් ගැන. එහෙමත් නැතිනම් යටත් විජිත කාලයේ අපට සිද්ධ වුණු හිරිහැර ගැන... නමුත් තමන් දැන් මුහුණදෙන යථාර්ථය කවියෙන් කියාපෑමට ගන්නා උත්සාහය ගැනත් ලංකාව වැනි අතීතයේ නොයෙක් ප්‍රශ්නවලට මුහුණ දුන් සහ තවමත් නොයෙක් ප්‍රශ්නවල පැටලී සිටින රටවල්වල සාකච්ඡා වෙන්න පටන් ගෙන තිබෙනවා. මේ කවි ලියැවුණේ ඒ වගේ වාතාවරණයකයි. 1970 පමණ කාලයේ පටන් ලංකාවේ සිදුවුණු නොයෙක් දේ මැද්දෙ, ඒ කියන්නෙ 1971 කැරැල්ල, 1980 දශකයේ ඇතිවුණු ලංකාවේ යුද්ධය යැයි කියන සිදුවීම් මාලාව යනාදිය අතරමැද රටේ ජනජීවිතයේ ඇතිවුණු ගැටලු තේමාකරගෙන තමයි, මේවා ලියැවුණේ.

**නිලන්ත** - ඔබගේ අවලස්සන අත්වැරැද්දක් නමැති කවි පන්තියේදී ඔබ මෙසේ කියනවා.

විහඟෙක් අහසේ පියාඹා
ගීතයක් ගැයූ දා සිට
ආදරයේ ආශාව

මොළයේ දැඩිව ලියැවිණ.

පරපුරෙන් පරපුරට
ලිංගිකත්වය මනෝ ලොව වැඩෙයි.

මොළයේ ගැඹුරුතම කොටස්
බීජයන් ය ප්‍රජනනයේ.

අධ්‍යාපනය කරන්නේ
ප්‍රජනනයෙන් කුලෑටිකම එළවා දැමීමයි
ගුරුන් සහ දෙගුරුන් කරන්නේ
තරුණ සිතුම් පැතුම්වලට බිය වීමයි.

ඔබේ කවිවල නිතර කියැවෙන මෙම තේමාව විස්තර කරන්න.

**බැසිල් ප්‍රනාන්දු -** මෙම කවිය ලිව්වෙ සැබෑ සිදුවීමක් පාදක කර ගෙනයි. පසුගිය වසරක එක දවසක එක යොවුන් දරුවෙක් අසභ්‍ය යැයි කියන, එහෙමත් නැතිනම් නිල් චිත්‍රපට යැයි කියා හඳුන්වන දෙයක් නරඹා තිබුණා. මේ බව කෙසේ හෝ ඉස්කෝලෙ විදුහල්පතිවරයා හට දැනගන්නට ලැබිලා විදුහල්පතිවරයා කළේ වහාම ඒ ළමයාගෙ තාත්තව පාසලට කැඳවලා එම චිත්‍රපටය පෙන්නලා, මෙහෙම තමයි තමන්ගෙ පුතා හැදිල තියෙන්නෙ කියලා කියා තිබුණා. ඒකෙන් විශාල කම්පනයකට පත්වුණු තාත්තා, ගෙදර ඇවිත් වෙඩිතියාගෙන මියගියා. ලංකාවෙ සංස්කෘතික වශයෙන්, ආදරය හා ලිංගිකත්වය පිළිබඳ ප්‍රශ්නවලට බුද්ධිමත් ව හා මානුෂිකව මුහුණදීමට නොහැකි වීම නිසා ඇතිවී තිබෙන විශාල ගැටලු - මානසික ගැටලු, භාවමය ගැටලු මේ ඇත්ත සිද්ධිය තුළ තිබෙනවා. යොවුන් හා තරුණ අයගේ ජීවිත අඳුරු කරන්නට විතරක් නෙවෙයි, වැඩිමල් අයගේ ජීවිතත් අඳුරු වී යන සිදුවීම් මේ ලිංගිකත්වය පිළිබඳ ප්‍රශ්නයට පුළුල් විදිහට මුහුණ දී ගන්න බැරිකම නිසා ඇතිවී තිබෙනවා.

අපේ රටේ තිබෙන්නේ ආදරයට බය සංස්කෘතියක්. එය එහෙම සිද්ධ වුණේ අතීතයේ නොයෙක් ආගමික මතවාදයන් ආදිය නිසා වන්නට පුළුවන්. කෙසේ නමුත් වර්තමාන ලෝකයේ ඉතා වැදගත් ලෙස සිද්ධ වුණු දෙයක් තමයි, විශේෂයෙන්ම පහුගිය අවුරුදු සියය විතර කාලය තුළ ආදරයට තිබුණු බය නැතිවී යාම. ආදරයම වැළඳගැනීම පිළිබඳ අදහස පහුගිය සියවසේදී මානව සමාජය තුළ සිදුවුණා. එය නරක දෙයක් හැටියට නෙවෙයි, රහසින් කළ යුතු දෙයක් හැටියට නෙවෙයි, ජීවිතයේ තිබෙන වැදගත්ම දේ හැටියට මිනිසුන්ගෙ පිළිගැනීම වැඩිවීම නිසා සිදුවූ දෙයක්. විශේෂයෙන්ම මා සිතනවා සිග්මන් ප්‍රොයිඩ් ආදීන්ගේ මනෝ විද්‍යාව පිළිබඳ ඇතිවූ අවබෝධය නිසා ලිංගිකත්වය හා ආදරය පිළිබඳ ප්‍රශ්න සම්බන්ධයෙන් වඩා ගැඹුරු අවබෝධයක් ලැබෙන්නට හේතුවුණා. නමුත් අදත් ලාංකීය සංස්කෘතිය තුළ මේවා විවෘතව කතාකිරීමට බැරි තත්වයක් තිබෙනවා. ඒ නිසාම තරුණයන්ගේ ආදරය වටා මෙවැනි ඛේදවාචක බොහෝ නිවෙස් තුළ සිදුවෙනවා. තරුණ හා යොවුන් දැරියන්ට මෙහි වැඩිම බලපෑමට ලක්වන්නට සිදුවෙනවා. ඔවුන්ට එක්කෝ කුඩා කාලයේදීම විවාහයන් සිදුකර දෙනවා. ඒ වගේම යම්කිසි සම්බන්ධයක් ඇති කරගන්නව නම් ඒ සඳහා මහා විශාල ගැටලු ඇති කරනවා. ඒ වගේ දේවල් තුළින් ඔවුන් තුළ ලිංගිකත්වය පිළිබඳ ප්‍රශ්නය සම්බන්ධයෙන් තුවාළයක් හදනවා. එය ඇත්තෙන්ම අපේ අවබෝධයට-සිතුම්පැතුම්වලට භාජනය විය යුතු වෙනවා. ඔය කවි පන්තියෙන් කියැවෙන්නේ ඒ වාතාවරණයයි. නමුත් ඒ වාතාවරණය හැම දෙයක් පුරාම දිවෙනවා. දේශපාලන ජීවිත කෙරෙහිත් එහි බලපෑම දිවෙනවා. මිනිසුන්ගේ නිදහසේ උත්තරීතරම ප්‍රකාශය තමයි, ලිංගිකත්වය පිළිබඳ නිදහස. එය කලාකරුවා තුළින් ප්‍රබල ලෙස-බියකින් තොරව ප්‍රකාශයට පත්විය යුතුයි.

**නිලන්ත** - මෙම කාව්‍ය සංග්‍රහයේ ඉතා ප්‍රබල කවියක් වන්නේ 1983 ජූලියේ තවත් එක සිද්ධියක් යන කවි පන්තියයි. එය රචනා කොට තිබෙන්නේ 83 කළු ජූලි කලබල කේන්ද්‍ර කර ගනිමින්. එහි එක් තැනක මෙසේ සඳහන් වෙනවා.



ඉන්පසු හදිසියේම
කමිසය සහ හිසකේ
එවිටත් පිළිස්සී
රිය තුළ සිටි මිනිසා
දොර කඩාගෙන පිටතට පැමිණ
ඉක්බිති නැමී,
ගත්තේය සිය දෙදරුවන් අතට.
සාමූහික තීරණයකින් මරණ දඬුවම ලබන්නා සේ
වටපිට පවා නොබලා.
ඉන්පසු තිරසාර ලෙස නැවතත්
නැංගේය රියටම...

ඉන්පසු තුමුම
දොර වසා ගත්තේය.
ඇසිණි මට ඒ හඬ
පැහැදිලිව වෙන් වෙන්ව...

**බැසිල් ප්‍රනාන්දු** - මේ කවි පන්තියට පාදක වී තිබෙන්නේත් සත්‍ය සිදුවීමක්. ඒ සිදුවීම ඒ දිනවලම මගේ ඉතා කිට්ටු මිත්‍රයෙක් මට කීවායින් පස්සෙ මේ කවි ලියැවුණා. ඒ සිද්ධියෙදි වෙලා තිබුණෙ, අපි කවුරුත් දන්නවා ඒ දවස්වල මිනිස්සු පාරට ඇවිල්ලා රථවාහන නතර කරලා, ඒ වාහනවල ඉන්නෙ දමිල අයෙක්ද කියල බලලා, ඒක එහෙම නම් ඒ වාහනවලට සමහර අවස්ථාවලදී පෙට්‍රල් දාලා ගිනිතියනවා. මේ සිදුවීම් මාලාවන් ඒ කාලයේ ජීවත් වුණු කාටවුණත් මතකයේ ඇති. ඒ දිනවල පාරට ගියානම් අනිවාර්යයෙන්ම මේ වගේ සිදුවීම් දැකගන්නට ලැබුණා. එවැනි සිද්ධියක එක් තැනකදි කොළඹ ම ජීවත් වුණු දෙමළ පවුලක්, ඒ කියන්නෙ පියා, මව සහ දරුවන් දෙදෙනෙක් වාහනයකින් එන අතරෙ මේ තත්වයට මුහුණ දෙන්න සිද්ධ වුණා. මෝටර් රථය නතර කරලා, මිනිස්සු පිරිලා. සමහර අය ඒ වෙන විටත් පෙට්‍රල් වත්කරන්න පටන් අරන්. නමුත් ඒ මැද, පිට ඉන්න කෙනෙක් දකිනවා, මෝටර් රියේ පිටුපස්සෙ ළමයි දෙන්නෙක් ඉන්න බව. ඔවුන් ගිහින් ළමයි දෙන්නව එළියට ගන්න හදනවා. ඒ විදිහට ළමයි දෙන්නව එළියට ගත්තා. ඒ කියන්නෙ, අම්මයි තාත්තයි මෝටර් රිය ඇතුළෙ ගින්නට මුහුණ දෙනවා, ළමයි එළියෙ... මේ අවස්ථාවෙදි තමයි, ඔය කවි පදවලින් කියැවුණු දේ සිද්ධ වුණේ.. පියා එළියට එනවා... ඒ වන විටත් ඔහුගෙ කමිසය සහ හිසකෙස්වල ගින්දර දකින්න පුළුවන්. ඔහු මේ ළමයි දෙන්නව වඩා ගන්නවා. වඩාගෙන මෝටර් රිය ඇතුළට ගිහින් වාඩිවෙලා දොර වහගන්නවා.

එතකොට මේ සිද්ධියෙන් මා සිතන්නේ සමාජයක් තුළ සාමූහිකත්වය පිළිබඳ හැඟීම් නැතිව ගියාට පසුව ඇති වුණු ඉතාම ගැඹුරු ප්‍රශ්නයක් මේ කවිපෙළෙන් ඉතා ගැඹුරින්ම කියැවෙනවා. එක අතකින්, ඒක ඇතුළෙ තිබෙන කුහකත්වය බලන්න. අම්මවයි තාත්තවයි පුච්චලා ළමයින්ට කරුණාවක් පෙන්වන්න හදනවා. ඔවුන් එහෙම කරන්නෙ ළමයින්ගෙම ඇස් ඉස්සරහපිට අම්මවයි තාත්තවයි පුච්චන අතරෙයි. මේ කුහකකම මැද ඒ තාත්තගෙ මොළය වැඩකරන හැටි බලන්න... තමන්ගෙ දරුවො ජීවත් වෙන්න යන්නෙ මොන වගේ සමාජයකද? මේව දැකල ජීවත් වෙන දරුවන් මොන වගේ අය බවට පත්වේවිද? ඒක මැද්දෙ, එවැනි ලෝකයක-එවැනි සමාජයක ජීවත් වෙන්නට වටිනවද? ඒ නිසා ඔහු දරුවන් දෙන්නව අතට අරන් ගිනි ගන්නා මෝටර් රථය තුළටම නැගලා, ඒ ගින්නට සමස්ත පවුලක් හැටියට එකට මුහුණ දෙනවා.

> " *මා සිතන්නේ සමාජයක් තුළ සාමූහිකත්වය පිළිබඳ හැඟීම් නැතිව ගියාට පසුව ඇති වුණු ඉතාම ගැඹුරු ප්‍රශ්නයක් මේ කවිපෙළෙන් ඉතා ගැඹුරින්ම කියැවෙනවා. එක අතකින්, ඒක ඇතුළෙ තිබෙන කුහකත්වය බලන්න. අම්මවයි තාත්තවයි පුච්චලා ළමයින්ට කරුණාවක් පෙන්නන්න හදනවා. ඔවුන් එහෙම කරන්නෙ ළමයින්ගෙම ඇස් ඉස්සරහපිට අම්මවයි තාත්තවයි පුච්චන අතරෙයි. මේ කුහකකම මැද ඒ තාත්තගෙ මොළය වැඩකරන හැටි බලන්න... තමන්ගෙ දරුවො ජීවත් වෙන්න යන්නෙ මොන වගේ සමාජයකද? මේව දැකල ජීවත් වෙන දරුවන් මොන වගේ අය බවට පත්වේවිද? ඒක මැද්දෙ, එවැනි ලෝකයක-එවැනි සමාජයක ජීවත් වෙන්නට වටිනවද? ඒ නිසා ඔහු දරුවන් දෙන්නව අතට අරන් ගිනි ගන්නා මෝටර් රථය තුළටම නැගලා, ඒ ගින්නට සමස්ත පවුලක් හැටියට එකට මුහුණ දෙනවා.* "

මේක ඒ කාලයේ බොහෝ දෙනෙකුගෙ සිත් තුළ සිද්ධවුණු දෙයක්. මෙයින් කියැවෙන්නේ එක දමිල පවුලක අත්දැකීම වුණත් බොහෝ දෙනෙකුට මේ සිද්ධීන් මැද්දෙ-මේ ප්‍රචණ්ඩත්වය මැද්දෙ ඇතිවුණු මානසික හැඟීම් මොනවද..? මීට පෙර අසල්වාසීන් වශයෙන්, යාළුවන් වශයෙන්, නෑදෑයින් වශයෙන්, එකට වැඩ කළ අය වශයෙන් හිටිය මිනිස්සු හතුරන් වගේ බෙදිලා එකා එකාව මරාගන්න තත්වයට පත්වුණාට පසුව එවැනි සමාජයක තිබෙන සමාජයීය හරයන් මොනවාද...? එය ජීවත් වීමට සුදුසු සමාජයක්ද? ඒ ගැඹුරු සමාජ ප්‍රශ්නය මතුකරන සිද්ධියක් වශයෙන් තමයි, මේ කවි පෙළ ලියැවුණේ. මේ කවිපෙළ මේ වන විට ලංකාව තුළ වගේම ලංකාවෙන් පිටත් සිය වතාවකට වඩා නොයෙක් ඉංග්‍රීසි ප්‍රකාශනවල නැවත නැවතත් මෙය පළ කර තිබෙනවා.

ලංකාව තුළ සිද්ධවෙමින් පැවති වෙනස - ඒ ගැඹුරු ගැටලුව මානුෂික පැත්තෙන් බලන්න. ඒ මානුෂික ගැටලුව හඳුනා ගන්න. මේ තේමාවට සමාන තේමාවන් නිරන්තරයෙන් මේ කවිවලදි ඔබට හමුවෙනවා. මේ ඊට සමාන තේමාවකින් යුත් තවත් කවි පෙළක්.

**ඔබේ ගෙට පිටුපසින් මුහුද නිසල විය**

අසූ තුන ජූලියේ එක් දවසක
අපේ රට උමතු වී සිටින සඳ
ඔබ බලන්න ආවෙමි
ඔබේ ගෙට පිටුපස මුහුද නිසසල විය.

ඔබ මා පිළිගත්තා පෙර කල මෙන්ම.
නමුත් යමක් වැරදී ගොසින් බව
දැන සිටියෙමු අප දෙදෙනම.
රැකි නිහඬතාවය මැන බැලීමු.

ඔබ ගුරුවරයා විය,
මම ගෝලයා වීමි.
ඒ සෙල්ලම අප පෙර කර තිබේ,

නමුත් එදා එය නතර විය

අපේ ප්‍රීතිමත් විශ්වාසයන් කුඩුපට්ටම් විය.
නොදන්නා ලොවක දිගහැරුම අපි දුටිමු.
ඉරණම අලස ලෙස සිනාසෙන හැටිද
දෙවියන් විහිලු කරන හැටිද.
ඔබේ ගෙට පිටුපසින් මුහුද නිසසල විය.

ස්වභාව ධර්මය, ගෙය පිටුපස තිබෙන මුහුද වෙනදා මෙන්ම නිසසලයි. නමුත් ගෙයක් තුළ-හැම ගෙයකම මෙන්ම මිනිසුන් අතර වෙනස්කමක් ඇතිවී තිබුණා. මේ සිද්ධියෙන් කියැවෙන්නේ පරණ ගුරුතුමෙක් මුණගැහෙන්න ශිෂ්‍යයෙක් යනවා. ශිෂ්‍යයා තමන්ගෙ ගුරුවරයාට බොහොම භක්තියෙන් සලකන අයෙක්. ඔවුන් හමුවුණාම ගුරුවරයා ගුරුවරයා ම වෙනවා. අතීත ශිෂ්‍යයා තවමත් ශිෂ්‍යයෙක් ලෙස ඔහු ඉදිරියේ හැසිරෙනවා. නමුත් එදා ඒ හැසිරීම වෙනස් වෙනවා. තමන් වටා තිබෙන ලෝකය වෙනස් වී ඇති බව දෙදෙනාම තේරුම් ගන්නවා. ලෝකය ගැන සැහැල්ලු බලාපොරොත්තු තිබුණ නම් ඒවා බිඳිල යන බව දෙදෙනාම තේරුම් ගන්නවා. නමුත් මේ සියල්ල අතරතුර මුහුද තවමත් නිසසලව පවතිනවා. මේ කවි පන්තිය ලියැවුණේ ජූලි සිදුවීම් වටා වුණත් ඉන්පසු කාලයේත් අද අපි ජීවත් වන යුගයටත් මේ අවිශ්වාසය පොදු දෙයක් බවට පත්වෙලා.

මේ තේමාව වටා දිවෙන කවි ගණනාවක් මේ පොතේ අන්තර්ගතයි. මේවා තුළින් අපි බොහෝවිට කතා කරන රට, එහෙමත් නැතිනම් ජාතිය පිළිබඳ අවබෝධය වෙනස් වෙනවා. ජාතිය නමැති කවි පන්තියේ ඒ බව මෙසේ කියනවා.

ඇතුළත වැළපීම පමණි
පිටත
ශ්‍රේෂ්ඨ ඉරියව්.



යම් නොදන්නා
යම් තැනකට
අප යනවා වැන්න.
අපට එළිපිට
වැළපිය හැකි තැනකට

එතැන අපි
කඳුළු ගංගාවලින්
අස්වද්දමු භූමිය
එවිට එහි වැඩෙනු ඇත
නව තුරු ද දිය කොමඩු ද.

රටක් ගොඩනැගෙන්නේ පුහු ආඩම්බරය තුළින් නෙවෙයි, පොදුවේ මිනිසුන් මුහුණදෙන වේදනාව තුළිනුයි. අද වන විට අපේ රට තුළ පැතිරී පවතින - කා තුළත් පැතිරී පවතින දැඩි වේදනාවක් පවතිනවා. මේ වේදනාව තුළින් ගොඩනැගෙන අදහස් හා අවබෝධය තුළින් නව පළතුරු, නව ගස් කොළං සමග නව සමාජයක් ගොඩනැගීම සිදුවීම වළක්වන්නට බැහැ. නමුත් එය බාහිරව බොහෝවිට ප්‍රකාශයට පත්වෙන්නෙ නැහැ.

මෙම තේමාව තවදුරටත් ප්‍රකාශයට පත්වන කවිපන්තියක් තමයි, සිව්මහා නදී පිළිබඳ කවිය.

පද්‍යාවලියේ කවි ගයන්නට
පුරුදුව සිටියෙමි මම.
මහවැලි, කැළණි, වළවේ කළු යන ගංගා
සමනොළ කන්ද මුදුනේ සිට පැන නැංගා
රත්තරන් පුතුන් ගැන ද
ගම්මානයන්හි හැදී වැඩෙන යුවතියන් ගැන ද
එසේම ඇසුවා කවි ගී.

ඉක්බිති මා දුටුවා,
මිනී පාවෙයි ගංගාවන්හි.
කඳුවැටිවල සිට ගැලූ වැසි දිය
මුසුවී තිබෙනු රුහිරු සමග
පාවෙන මළ මිනී
කෑවා කබරගොයි.

දැන් මා අකමැතියි අසන්නට
වළවේ, කැළණි සහ කළු ගැන.
කඳුවැටිවලට අහිමි විය
අද්භූත බව හෝ ආකර්ෂණය
මව්වරුන්ගේ දෑසේ මා දුටුවේ
කඳුළු නොව අවිශ්වාසයයි.

පණස් ගණන්වල පාසල් ගිය මා වැනි අයට පී.බී අල්විස් පෙරේරා කවියා විසින් රචිත පද්‍යාවලිය ඉතා හුරු පුරුදු කවි පොතක්. එහි කාටත් කටපාඩමින් තිබුණු කවියක් තමයි, මහවැලි කැළණි වළවේ කළු යන ගංගා-සමනොළ කන්ද මුදුනේ සිට පැන නැංගා යන කවිය. එදා කවියාගේ අදහස වුණේ රටේ තිබුණු සුන්දරත්වය විස්තර කිරීමයි. ස්වභාවික සුන්දරත්වයට උරුමකම් කියන ලංකාව වැනි රටක එවැනි කවීත්වයක් ඇතිවීම ස්වභාවිකයි. නමුත් ඊට පසු කාලයේ එනම් පණස් ගණන් පසු කරගෙන හැත්තෑව, අසූව සහ දැන් කාලයට එළඹ සිටින අපි දකින්නෙ බාහිරව පවතින සුන්දරත්වය විතරක් නෙවෙයි. ඒ සුන්දරත්වය එදා වගේම අදටත් බාහිරව තිබෙනවා. නමුත් ඒ බාහිර සුන්දරත්වයට යටින් හැම ජීවිතයක් තුළම ඒ තරමට සුන්දර නොවෙන අභ්‍යන්තරයක් ද තිබෙනවා. එදා ගංගාවල පාවී ගිය තරුණ ජීවිත - ඒවා දකුණේ තරුණයන්ගේ වුණත් උතුරේ තරුණයන්ගේ වුණත් එහෙමත් නැතිනම් සොල්දාදුවන්ගේ වුණත් - ඒ තරුණ ජීවිතවල රූප තුළින් කිළිටි වුණු ගංගාවන්, දියපාරවල්, කඳු මුදුන් තුළින් සංකේතවත් වන අභ්‍යන්තරය උලුප්පා මතුකර දැක්වීමයි, කවියෙකු අතින් සිද්ධවිය යුතු වන්නේ. මේ පොතේ තිබෙන කවි පන්ති හැත්තෑ දෙකටම ඒ මතය තේමා වී තිබෙනවා.

“

එදා ගංගාවල පාවී ගිය තරුණ ජීවිත - ඒවා දකුණේ තරුණයන්ගේ වුණත් උතුරේ තරුණයන්ගේ වුණත් එහෙමත් නැතිනම් සොල්දාදුවන්ගේ වුණත් - ඒ තරුණ ජීවිතවල රූප තුළින් කිළිටි වුණු ගංගාවන්, දියපාරවල්, කඳු මුදුන් තුළින් සංකේතවත් වන අභ්‍යන්තරය උලුප්පා මතුකර දැක්වීමයි, කවියෙකු අතින් සිද්ධවිය යුතු වන්නේ.

”



# න ට ත්   ර ජේ ක්   උ ම තු   ම ති න්

නටත් රජේක් උමතු මතින්

මට ඕනෙ නම් ෆේස්බුක් තහනම් කරන්න වුණත් පුළුවන්" යැයි පානදුර ප්‍රදේශයේ බාලිකා පාසලකදී මහරජා කීවේය. ලංකාවේ මේ වන විට ඉතා ප්‍රබල සමාජ ජාල මාධ්‍යයක් බවට ෆේස්බුක් පත්වී ඇති බවත් සමහර මාධ්‍යයන් සිය ප්‍රචාරණ කටයුතු පමණක් නොව සන්නිවේදන කටයුතු පවා ඉතා ප්‍රශස්ත අයුරින් ෆේස්බුක් හරහා සිදුකරගෙන යන බවත් ජිල්මාට් පුත්‍ර රත්නයක් සිය පවුලේම ඥාතියෙකු වශයෙන් සිටින නිසා මහරජා ඉතා හොඳින් දන්නවා වන්නට ඇත. බාලිකාවේදී නම් රජා කීවේ බොළඳ කතාවකි. "ඔය ෆේස්බුක්වලින් ජේන අයට වඩා ගෙදර ඉන්න කෙනා අගෙයි' කියා රජා ලෝකෙට කීවේ, කෙල්ලන්ගේ සදාචාරය පිරිහීමට ෆේස්බුක් හේතුවක් යැයි සිතෙනා නිසා එය වසාදමන්නට වුණත් පුළුවන් බවකි. ව්‍යාජ හේතුවේ තවරා සැබෑ හේතුව වසං කිරීමේ මැදමුලන ගතිය එයයි. මේ අනුව නොබෝ දිනකින් විසම්මුතියට ඉඩ ඇහිරීමේ සහ විරුද්ධ මත වනසා, මේ ලංකාවේ තිබෙන සියලු මාධ්‍ය මැදමුලන හිතවාදී කිරීමේ පරම අරමුණින් චීනය ආදර්ශයට ගෙන ටික කලකට හෝ ෆේස්බුක් අවහිර කළොත් ලැජ්ජා නැතිව දැනටමත් කඬේ යන ප්‍රධාන ධාරාවේ මාධ්‍ය එය උදම් අනමින් වාර්තාකරනු ඇත. මාධ්‍ය නිදහස ස්ථාපිත කිරීම සඳහා ගත් මෑත ඉතිහාසයේ ගත් දැවැන්තම පියවර ලෙස පවා ආචාර්ය මහා සමයම වැනි අය එය සලකන්නට ඉඩ තිබේ.

මහ රජා දැන් දැන් වගවීම ගැන පවා කිසිම වගකීමක් නැති ප්‍රකාශ කරන්නේ පිස්සු තද වූ ගානට ය. මේ සඳහා මෑතකාලීන උදාහරණ බොහෝ ය. අල්ජසීරා පුවත් සේවය ඉදිරියේ හරි මාන්නක්කාර ආඩම්බර තාත්තාගේ චරිතය රඟපෑමට ඔහු බොහෝ සේ මහන්සි වූයේය. නමුත් අඩුම ගණනේ සෝවියට් රුසියන් සුරංගනා කතාවල එන 'ලොකු නුවණක්කාර පුංචි ඉවාන්' ගේ චරිතයේවත් අහලකට යන්නට ඔහුට පුළුවන් වුණේ නැත. ඇත්තම කියනවා නම් ලැජ්ජානැති කම මහ මුදලිකමටත් වඩා ලොකුයි' යන්නට වඩා වෙන මෙලෝ යම් දෙයක් ඔහුගේ කතාවෙන් දැක්වුණේ නැත. ඒ වැඩසටහන නිසා සාධාරණ පුරවැසියන්ට මෙන්ම අල් ජසීරා මාධ්‍යවේදියාටද

තමන් ගැනම ලැජ්ජාවක් ඉපදෙන්නට ඇත. මැතිවරණය ආවරණය කිරීම සඳහා අල් ජසීරාවට ඉඩ නොදුන් තමාගේ කකුල් දෙක ළඟට අල් ජසීරා ආවා නොවේදැයි මහරජා සිතින් උදම් අනන්නට ඇත. ලංකාවේ රාජ්‍ය නායකයා නිකම්ම නිකං මෝඩ ආතල් ගන්නෙකුගේ තත්වයට පත්ව සිටීම එකවර සිනාසෙන්නටත් හඬන්නටත් හැකි කාරණාවකි.

ගණන් නොගෙන සිටීමේ මුද්ධකම මහරජා ඉහටත් උඩින් ප්‍රගුණ කර තිබෙන ශිල්පයකි. විපක්ෂයේ මන්ත්‍රීවරුන් සල්ලිවලට බිලී බා ගන්නා විට ලෝකයේම මාධ්‍ය මොන මොනවා කීවත් ඔහු ගණනකට ගත්තේ නැත. එතැනින් පටන් ගත් ගමන තුළ ඔහු දැන් සිටින්නේ 'උඹලා මොන මොනවා කීවත් කළත් මමයි රජා' යන මානසිකත්වයේ ය. සාමාන්‍යයෙන් රටේ දැවෙන ප්‍රශ්නයක් තිබෙන විට මහරජා පාර්ලිමේන්තුවට එන්නේ නැත. ඒ තබා බාලිකා පාසලකටවත් යන්නේ නැත.

'සිකුරාදා සංසදය' (ෆ්‍රයිඩේ ෆෝරම්) මේ වන විට මහරජා වෙත විශේෂ ආයාචනයක් කර තිබේ. 2012 නොවැම්බර් මාසයේ රැඳවියන් විසිහත් දෙනෙකුගේ දිවි තොර කළ වැලිකඩ බන්ධනාගාර සිද්ධිය පිළිබඳවත් 2012 ජූනි මාසයේ රැඳවියන් දෙදෙනෙකුගේ දිවි තොර කළ වව්නියා බන්ධනාගාරයේ සිද්ධිය පිළිබඳවත් පත් කළ පරීක්ෂණ කොමිෂන් සභාවන්ගේ වාර්තා මහජනයා වෙත ප්‍රසිද්ධ කරන්නැයි ඔවුන් විසින් ඉල්ලීමක් කර තිබේ. නමුත් ප්‍රශ්නය වන්නේ මහරජාට කන් ඇසේද යන්නයි. මහරජාට ඇසෙන්නේ ඔහු අසන්නට කැමති දේ පමණි. අනෙක් දේවල් ඇසුණු වහා ඔහු ක්ෂණික බිහිරිතාවකට පත්වෙයි. අතීතයේ ද මෙවැනි දේ සම්බන්ධයෙන් ඔහුගේ කන් බීරි වූ අතර තමන්ගෙන් උත්තර ඉල්ලා සිටිමින් මෙවැනි ලිපි ලියන්නේ කවුද සහ ඒ ලියන එවුන් බයක් හැකක් නැතිව පිනුම් ගසන්නේ ලංකාව තුළ සිටද, එය එසේ නම් මඩ ගාගන්නේ නැතිව උන් ගැන වගබලාගන්නේ කෙසේද වැනි වැදගත් කාරණා සිතමින් මෙවැනි ලිපි ලැබුණු විට මහරජා සුපුරුදු පරිදි නොසන්සුන් වනු ඇත. මේක උමතුවේ යුගයකි. මහරජා උමතුවෙනි.



## උමතුව නිතරම බලය කැටුව එයි.

විධායක ජනපති සියුස්
වගකීමක් නැතිව කළේය නියෝග
නපුරු වීමට බලවතුන් සතු වරප්‍රසාදය.
ප්‍රොමිතියස් ව බැඳ දමා
පල්ලමකට පෙරළිය යුතු.
රිදී කෙවිට ගළවා දමා නැවත වැඩෙනු පිණිස
සඳහටම.
ප්‍රොමිතියස් කළේ හොඳ දෙයක්
මිනිස් වගට
ලබාදී ගින්දර
කෑම පිසීමට
රස බොජුන් කෑමට,
උණුසුම් වීමට
ශීත කාලවලදී.
පහසු කරනට ජීවිතය.

මෙයින් උමතු විය මහ මිනිහා
උමතු කම එන්නේ බලය කැටුව නිසා.
ඔයින් මෙයින් ඇරඹිණ සියුස්ගේ පීඩනය
සහ ඔහුගේ බිය සහ නපුරු හීන.
කැරළි ගැසීමට ඉඩ ඇතැයි මිනිස් වග
සිය ෆැන්ටසියේදී ඔහු දුටුවේ හැමකෙක්ම
පළිගන්නට මාන බලන
ප්‍රොමිතියස් කෙනෙක් සේ ය.

\- 'හඬනු මැන දේශය' බැසිල් ප්‍රනාන්දු කාව්‍ය සංග්‍රහයෙන්





# ශ්‍රී ලංකා පොලීසියට පරපීඩා කාමුකත්වය

***ආචාර්ය සුනිල් කුරේ සමග ශ්‍රී ලංකාවේ පොලිස් වධ හිංසාව පිළිබඳ සම්මුඛ සාකච්ඡාවක්***

*පහත දැක්වෙන සම්මුඛ සාකච්ඡාව, Torture: Asian and Global Perspectives හි නවතම කලාපයේ මුල් වරට පළ විය.*

ආචාර්ය සුනිල් කුරේ ශ්‍රී ලංකාවේ ඉතා ප්‍රකට ජ්‍යේෂ්ඨ නීතීඥවරයෙකි. වසර 46 ක්

මුළුල්ලේ ඔහු නීති වෘත්තියේ නියැළී සිටියි. තවද ඔහු ශ්‍රී ලංකාවේ පරිපාලන නීතියේ සිද්ධාන්ත පිළිබඳ වෙළුම් දෙකකින් යුත් ප්‍රාමාණික පාඨග්‍රන්ථයන් හි කතුවරයා ද වෙයි. ආසියානු මානව හිමිකම් කොමිසමේ බැසිල් ප්‍රනාන්දු, ශ්‍රී ලංකාවේ වධ හිංසාවේ භාවිතය පිළිබඳ ආචාර්ය සුනිල් කුරේ සමග සම්මුඛ සාකච්ඡාවක යෙදෙයි.



TORTURE: ASIAN AND GLOBAL PERSPECTIVES | JUNE-AUG 2013 VOLUME 02 NUMBER 02 & 03

INTERVIEW: NARRATIVE OF JUSTICE

AHRC File Photo: Sri Lanka police brutality

Sadistic Tendencies Of The Police

*An Interview with Dr. Sunil Cooray on Torture in Sri Lanka*

*Dr. Sunil Cooray is a senior lawyer who is very well known in Sri Lanka. He has been in legal practice for 46 years. He is the author of the two volumes of the authoritative text Principles of Administrative Law in Sri Lanka. Basil Fernando of the Asian Human Rights Commission interviews Dr. Sunil Cooray on practice of torture in Sri Lanka.*

***බැසිල් ප්‍රනාන්දු : ශ්‍රී ලංකාවේ වධ හිසාවට සම්බන්ධ නඩු ගණනාවක් ඔබ විසින් මෙහෙයවා තිබෙනවා. අපට ඔබේ අත්දැකීම්වලින් ස්වල්පයක් පිළිබඳ කියන්න.***

***සුනිල් කුරේ :*** වධ හිංසා නඩුවලදී මා වැඩි වශයෙන් පෙත්සම්කාර පාර්ශවය වෙනුවෙනුත් අවස්ථා කිහිපයකදී වගඋත්තරකාර පොලිස් නිලධාරීන් වෙනුවෙනුත් පෙනී සිට තිබෙනවා. මගේ අත්දැකීම තමයි, අපේ අධිකරණ සාමාන්‍යයෙන් වගඋත්තරකරුවන්ගේ පැත්තට නැඹුරු වන බව. වෙන විදිහයකින් කියනවා නම්, පෙත්සම්කරුට එරෙහි චෝදනා ඔප්පු වී නැති බව කියාපාන්නට ඔවුන් පුළුවන් තරම් දුරට උත්සාහ ගන්නවා. මම පෙනී සිටින්නේ වගඋත්තරකරුවන් වෙනුවෙන් නම් ඒක හරි. නමුත් මට පෙනෙනවා, පොලිස් නිලධාරීන් සහ බන්ධනාගාර නිලධාරීන් විසින් තමන්ට වධ හිංසා පැමිණවූ බව විනිසුරුවරුන්ට ඒත්තු ගැන්වීම පෙත්සම්කරුට තරමක් අසීරු දෙයක්. ඒ බව මම අත්දැකලා තිබෙනවා.

***බැසිල් ප්‍රනාන්දු : ඔබ සිතන විදිහට ඇයි මෙහෙම වෙන්නෙ? අධිකරණයේදි පාර්ශවයන් දෙකම සමාන විය යුතුයි. ඒ වගේම සාක්ෂිත් අනුකූල වන පරිදි අගැයීමට ලක් කළ යුතුයි. උදාහරණයක් විදිහට, ශ්‍රී ලංකාවේ වෛද්‍ය සාක්ෂි සහ ඒ හා සමාන දේ යොදාගන්නවා. ඔබ සඳහන් කළ අසීරුතාවය යම්කිසි ආකාරයක මානසික ගැතිභාවයක ප්‍රතිඵලයක් ද?***

***සුනිල් කුරේ :*** මා සිතන්නේ එහෙමයි. එය යම්කිසි මානසික තත්වයක් වැනි දෙයක්. මොකද, ශ්‍රේෂ්ඨාධිකරණයේ- සියලු මූලික අයිතිවාසිකම් නඩු අසනසිටින ශ්‍රේෂ්ඨාධිකරණයේ සිටින අපේ විනිසුරුවරුන්ගෙන් බහුතරය එන්නේ නීතිපති දෙපාර්තමේන්තුවෙන්. නීතිපති දෙපාර්තමේන්තුවේ නඩු කතා කරන නීතීඥවරුන් වශයෙන් ගත කළ ජීවිත කාලය පුරාම ඔවුන් පොලිස් නිලධාරීන් සමග සමීපව කටයුතු කරනවා. පොලීසිය කියන දෙය, සාමාන්‍ය පුරවැසියෙකුට කියන්න තියෙන දෙයට වඩා විශ්වාස කරන්නට ඔවුන්ගේ නැඹුරුතාවයක් තිබෙනවා. මම හිතන්නෙ මේක ප්‍රශ්නයේ කොටසක්.

***බැසිල් ප්‍රනාන්දු : ඔබ*** *Narrative of Justice In Sri Lanka told through stories of torture victims* ***පොත දැක තිබෙනවාද?***

***සුනිල් කුරේ*** : ඔව්.

***බැසිල් ප්‍රනාන්දු : වධ හිංසා සිද්ධීන් 400 ක් ගැන එහි සඳහන් වෙනවා. එවැනි සිද්ධි විශාල සංඛ්‍යාවක් තිබෙනවා. වධ හිංසාව සම්බන්ධයෙන් මේ වගේ පුළුල් ලෙස පැතිරුණු භාවිතයක් පැවතීමට හේතුව, ඔබ සිතන විදිහට කුමක්ද?***

***සුනිල් කුරේ*** : මං හිතන්නෙ එයට හේතු ගණනාවක් තිබෙනවා. ඒ වගේම මම හිතනවා, වධ හිංසාව අවම කිරීමට හෝ තුරන් කිරීමට පවා කළ හැකි දේ තිබෙනවා කියා. මං හිතන ආකාරයට වධ හිංසාවක් සිද්ධ වීමට බලපාන හේතු ගණනාවක් තිබෙනවා. එයින් එක් හේතුවක් වෙන්න පුළුවන්, සමහර පොලිස් නිලධාරීන්ගේ පරපීඩාකාමී නැඹුරුතාවයන්. ඔවුන් අහිංසක මිනිහෙක් අල්ල ගත්විට, ඒ අනාරක්ෂිත මිනිසාට පහර දීම මගින් සිය පරපීඩාකාමී නැඹුරුව තෘප්ත කරගන්නට ඔවුන් හට උවමනා වෙනවා. ඒ වගේම බොහෝ පොලිස් නිලධාරීන් හවසට මත්පැන් බොනවා. ඔවුන් දැඩි විදිහට මත්පැන්වල බලපෑමට නතුවෙලා සිටින විට කිසිම ආරක්ෂාවක් නැති-ඔවුන් වෙනුවෙන් කිසිම අයෙක් නැති වෙලාවක ඒ මිනිස්සුන්ගෙන් පොඩි විනෝදයක් ලබාගන්න ඔවුන්ට උවමනා වෙනවා. ඒ මිනිස්සු බොහෝවිට දුප්පත් අය. ඔවුන්ව හිරිහැරවලටත් වධ හිංසාවන්ටත් ලක් කරනවා.

ඒ වගේම මේ සඳහා බලපාන වෙනත් හේතුන් ද තිබෙනවා. උදාහරණයක් විදිහට, හරි හෝ වැරදි වේවා, යම්කිසි පුද්ගලයෙක් යම් සිද්ධියකට අදාළව අල්ලා ගත්විට, ඒ කෙනාව වධ හිංසාවට ලක් කරන්න කියන උපදෙස් පොලීසියට යම්කෙනෙක් විසින් ලබාදී තිබෙන්න පුළුවන්. මේක දේශපාලන හේතු නිසා හෝ ඒ හා සමාන වෙනත් හේතු නිසා සිද්ධ වෙන්න පුළුවන්. කෙළින් වැඩ කරන පොලිස් නිලධාරියෙකු පවා මේ තත්වය යටතේ යම්කිසි ආකාරයක ප්‍රේරණයකට ලක්වෙන්නට පුළුවන්. හේතුව, එයට අවනත නොවුණහොත් තමන්ට ස්ථාන මාරුවක් හෝ විනය ක්‍රියාමාර්ගයක් හෝ ඒ හා සමාන වෙනත් බලපෑමකට ඔහුට යටත් වෙන්නට සිදුවිය හැකියි.

මුදල් ලබාගැනීම සඳහාත් පොලිසිය විසින් වධ හිංසා පමුණුවනවා. එය පොලිස් නිලධාරීන්ගේ වේතනය මත රඳා පවතිනවා. ඒ අනුව මෙවැනි පැති ගැනත් බැලිය යුතුයි. පොලිස් නිලධාරීන්ට ජීවන දීමනාවක් ගෙවිය යුතුයි. එවිට ඔවුන්ට තමන් සහ තම පවුල්වල අය සුව පහසුවෙන් තබන්නට පුළුවන්. ඒ කියන්නෙ මුදල් අඩුපාඩු එක් හේතුවක් වෙන්නට පුළුවන්. ඒ වගේම ඇත්ත වශයෙන්ම සාමාන්‍ය හැඟීමක් තිබෙනවා, ඒ වගේම විනිසුරුවරුන් සහ නීතිඥවරුන් ද එයට එකඟ වෙනවා. එය තමයි, වධ හිංසාව කියන්නේ සම්පූර්ණයෙන්ම තහනම් කරන්නට බැරි දෙයක් කියලා. එයට හේතුව, ඔවුන්ට අනුව වධහිංසාව විමර්ශනවලට අනුකලනය වූ කොටසක්. එය සම්පූර්ණයෙන්ම වැරදි මතයක් සහ ඇත්ත වශයෙන්ම එය නීති විරෝධී මතයක් වුණත් අවාසනාවකට වගේ ඒක අපේ විනිසුරුවරුන් සහ නීතිඥවරුන්ගේ හිස්වලට ඔබ්බවා තිබෙන දෙයක්. ඒ වගේම ඔවුන් පෙත්සම්කරුගේ පැත්ත ගැනීමට වඩා වධ හිංසාව සිදුකළ බවට චෝදනා ලබා සිටින පොලිස් නිලධාරීන්ගේ පැත්ත ගැනීමට ඒකත් එක හේතුවක් වෙනවා.

***බැසිල් ප්‍රනාන්දු : ආණ්ඩුව හෝ ඉහළ පෙළේ පොලිස් නිලධාරීන් විසින් වධ හිංසාව වැරදි දෙයක් කියන සෘජු අවංක පණිවුඩය කිසිම අවස්ථාවකදී ලබාදී නැහැ කියා කීවොත් එය නිවැරදි ද?***

***සුනිල් කුරේ*** : මං හිතන්නෙ ඒක එහෙමයි. ඉහළ නිල දරන පොලිස් නිලධාරීන් තමන්ගේ පහළ නිලවලට වධ හිංසා නොකරන්න කියා කියන විට එසේ කීමේ කිසිම අවංක කමක් තිබෙනවා යැයි මම හිතන්නෙ නැහැ. එහෙම කීවත් කියන්නේ ඇත්තටම නොවෙයි. වධ හිංසා නොකළ යුතුයි කියන එක නිකම්ම නිකම් වචන කිහිපයක් පමණක් යැයි ඔවුන් සිතනවා. මා සිතන්නේ ඔබ පැවසූ දෙය හරියටම හරි.

***බැසිල් ප්‍රනාන්දු : ඒ කියන්නේ වෙනත් වචනවලින් කියනවා නම් වධ හිංසාව පාවිච්චි කිරීම නිල නොලත් ප්‍රතිපත්තියක් පිළිගැනීමක්***

***සුනිල් කුරේ*** : යම්කිසි ආකාරයක නිල නොලත් ප්‍රතිපත්තියක්. නමුත් මට විශ්වාසයි, ඒ වගේ ප්‍රතිපත්තියකට වැඩිකල් පැවැත්මක් නැහැ.

මට විශ්වාසයි, අපේ විනිසුරුවරුන්ගේ, නීතිඥවරුන්ගේ සහ ජ්‍යෙෂ්ඨ පොලිස් නිලධාරීන්ගේ ඔළුවෙ තිබෙන මේ අදහස වැඩි කාලයක් පවතින එකක් නැහැ කියලා. මම විශ්වාස කරනවා, මේ අදහස තවදුරටත් නොපවතින දිනයක් ඒවි කියලා. මොකද වධහිංසාව කෲර දෙයක් වන නිසා. නූතනයේ පිළිගත් මතයට අනුව වධ හිංසා පැමිණවීම කෲර සාහසික දෙයක්. අපේ විනිසුරුවරුන්ගේ සහ නීතිඥවරුන් අතරින්, වධ හිංසාව මුලිනුපුටා දමන දිනය උදාවේවි කියා මම බලාපොරොත්තු වෙනවා.

***බැසිල් ප්‍රනාන්දු : මේ තරම් විශාල සිද්ධි සංඛ්‍යාවකින් නිසැකවම පෙනී යන දෙය තමයි, නොවැදගත් හෝ ඉතා සුළු දේවල් සම්බන්ධයෙනුත් වධ හිංසාව සිදුකරන බව.***

***සුනිල් කුරේ :*** ඇත්ත වශයෙන්ම. ඒ කතාව නිවැරදියි.

***බැසිල් ප්‍රනාන්දු : ඉතින් ඒකෙන් අදහස් වෙන්නෙ නැත්ද, අපරාධ විමර්ශනයේ නියම අදහස යොදාගෙන නැති බව? අපේ අපරාධ නඩු විධානය එක්ක මේ දේවල්වලට කළ හැකි දෙයක් තිබෙනවද?***

***සුනිල් කුරේ :*** අපරාධ නඩු විධානය, ඔව්, ඒත් මට කියන්න පුළුවන් ඒකත් ප්‍රමාණය පිළිබඳ දෙයක් කියලා. උදාහරණයක් විදිහට, තමන් විමර්ශනය කළ සිද්ධි සංඛ්‍යාව පොලිස් නිලධාරියෙක්, ප්‍රදේශයේ ඕඅයිසී නිලධාරියා විසින් පෙන්වන්ට අවශ්‍යයි. ඒ වගේම අපරාධකරුවන් බොහෝ දෙනෙක් අල්ලලා ඔවුන්ව උසාවි දමලා, මම මගේ රාජකාරිය කළා කියලා පෙන්වන්නට අවශ්‍යයි. ඔහු කියනව නම් සිද්ධි බහුතරයකදි අපරාධකරුවන් ව අල්ලන්නට තමන්ට බැරි වුණා කියලා, ඔහුගෙ උසස් නිලධාරීන් ඔහු දිහා හොඳ ආකාරයට බලන්නෙ නෑ. ඒ නිසා ඔහු ප්‍රතිඵල පෙන්විය යුතුයි. ඔවුන් වරදකරුවන් වුණා ද නැතිද කියන එක වෙන ප්‍රශ්නයක්. නමුත් තමන් විමර්ශනයක් කළා, අපරාධවලට වගකිවයුත්තන් අල්ලගත්තා සහ ඔවුන් ව අධිකරණය ඉදිරියට ගෙන ගියා කියලා අඩුම ගණනෙ තමන්ගෙ උසස් නිලධාරීන්ට කියන්න ඔහුට පුළුවන් වෙන්න ඕනෙ. ඇත්ත වශයෙන්ම වධ හිංසාව භාවිතා කිරීම මගින්, පාවිච්චි කෙරුව ආයුධය මොකක්ද සහ වෙනත් එවැනි දේ ගැන විවිධාකාර සාක්ෂි ලබාගැනීමට ඔහු උත්සාහ කරනවා. වධ හිංසාව යටතේ පොලීසියට සිදුකරන ප්‍රකාශ, ශ්‍රී ලංකා නීතිය සහ ඉන්දියානු නීතිය යන නීති දෙක යටතේම අධිකරණයට ඉදිරිපත් කරන්නට බැහැ, විශේෂයෙන්ම ඒක පාපොච්ඡාරණයක් නම්.

ඒ නිසා එයත් ප්‍රශ්නයේම කොටසක්. ප්‍රමාණය.. පොලිස් නිලධාරීන් තමන්ගේ උසස් නිලධාරීන්ට ප්‍රමාණය පෙන්වන්නට ඕනෙ.. සාර්ථක ව සිදුකෙරුව විමර්ශන ගණන පෙන්වන්නට ඕනෙ.

***බැසිල් ප්‍රනාන්දු : දැන් ඔබට පෙනෙනවා, නූතන නීති විද්‍යාත්මක එළඹුමක් විනිසුරුවරුන් සහ නීති වෘත්තිකයන් අතර පවතිනවාද යන්න මත වධ හිංසාව පිළිබඳ ආකල්පයේ වෙනසක් සිදුකිරීම විශාල වශයෙන් රඳා පවතින බව. ඒ අනුව බලන විට ඔබ කොහොමද ශ්‍රී ලංකාවෙ තත්වය ඇගයීමට ලක් කරන්නෙ..?***

***සුනිල් කුරේ :*** ශ්‍රී ලංකාවෙ තත්වය තුළ ඇත්ත වශයෙන්ම, නීතිඥවරුන්ගෙ සහ විනිසුරුවරුන්ගෙ මනෝවිභීතිය ඒ වෙතට සකස් වෙලා නැහැ. මා සිතන්නේ මේ දේවල් වෙනස් විය යුතුයි. ඒ වෙනස පටන් ගත යුත්තේ නීති විද්‍යාලයෙන් සහ නීති සරසවිවලින්. වධ හිංසාව කොතරම් පැතිර තිබෙනවාද යන්න ගැන අවදියක් ඇති කළ යුතුයි. පොලිස් ස්ථානයකදී සිදුවන සියලු දේ වාර්තාගත කර තිබෙන ඔබේ ප්‍රකාශනය වැනි දේවලින් එය සිදුවෙනවා. ඔබ විසින් ප්‍රකාශනය කර තිබෙන ලේඛන, වධ හිංසා සිද්ධි 401 ඔස්සේ යම් කෙනෙක් යනවා නම් ඔවුන් තමන්ගේ ආකල්ප වෙනස් කර ගැනීමේ ප්‍රවණතාවක් තිබෙනවා. විශේෂයෙන්ම නීතිඥවරුන් පැමිණෙන්නේ යම්කිසි නිශ්චිත පන්තියකින්. ඔවුන් පැමිණෙන්නේ වධ හිංසාවට ලක්වන ජනතාව අයත්වන පන්තියෙන් නොවෙයි. නමුත් එවැනි මිනිසුන් පිළිබඳ ඔවුන් දැනුවත් විය යුතුයි. ඒ දැනුම ඔවුන්ට ගෙදර ගෙනියන්නට පුළුවන් වන්නේ මෙවැනි ප්‍රකාශන මගින් පමණයි. මා සිතනවා

අනාගතයේදී, ඔබත් යෝජනා කළ විදිහට, වධ හිංසා සිද්ධි අධීක්ෂණය කරන, වාර්තා කරන සහ ලේඛනගත කරන යාන්ත්‍රණයක් ඇති විය යුතුයි කියා.

***බැසිල් ප්‍රනාන්දු : මෙවැනි ප්‍රතිපත්ති ගැටලුවක් ගැන පොලිස් ධුරාවලිය සිතන ආකාරයට, නීතීඥ සංගමය සහ එවැනි වෙනත් සංවිධානවලට බලපෑම් සිදුකළ හැක්කේ කවර ක්‍රමවලට කියා ඔබ සිතනවාද?***

***සුනිල් කුරේ :*** නීතීඥ සංගමය තුළ නීතියේ ආධිපත්‍යය පිළිබඳ කමිටුවක් තිබෙනවා. වධ හිංසා තත්වයන් පිළිබඳ සැලකිල්ලෙන් සිටීම සහ ඒවා අධීක්ෂණය කිරීමට එමගින් බලාපොරොත්තු වෙනවා. ඒ අනුව ලංකාව පුරා සිදුවන වධ හිංසා සිදුවීම් ගැන දත්ත එක්රැස් කිරීමේ සහ ඒවා ලේඛනගත කිරීමේ වගකීම මේ කමිටුවට ගත හැකියි. එය කළ හැකි එක දෙයක්. ඒ වගේම ඔවුන්ට පුළුවන් ඒවා ප්‍රසිද්ධ කරන්නට. ඒ වගේම, ඉහළ නිලයන්ට අයත් පොලිස් නිලධාරීන් සම්බන්ධ කර ගෙන ඔබ ගෙන එන වීඩියෝ පට සහ දේශනා ඔවුන්ට ලබාදෙන්නට පුළුවන් නම් එයින් අවධාරණය කරන්නට පුළුවන්, වධ හිංසාව සිද්ධ විය හැකියි සහ එය සිද්ධ වෙනවා කියන කාරණය. මේක, නීතීඥ සංගමයේ නීතියේ ආධිපත්‍යය කමිටුව කරන එක දෙයක්.

***බැසිල් ප්‍රනාන්දු : මූලික අයිතිවාසිකම්වල අනාගතය ගැන ඔබ සිතන්නේ කුමක්ද? විශේෂයෙන්ම වධ හිංසාව වැනි ගැටලුවලට අදාළව?***

***සුනිල් කුරේ :*** ඇත්ත වශයෙන්ම මූලික අයිතිවාසිකම් ජීවමාන වේවි. ඒවා වර්තමානය වැනි අන්ධකාරයට වැසී ගිය කාලපරිච්ඡේද සහ අවධීන් තිබේවි. එය අධිකරණය සහ නීති වෘත්තිය මත රඳා පවතිනවා. ඒ කියන්නේ, නීති වෘත්තිය මේ ගැටලු මතුකරන්නට කොයිතරම් දුරකට නිර්භීත වෙනවාද සහ වධ හිංසා පිළිබඳ චෝදනා විනිසුරුවරුන් විසින් කොයිතරම් දුරකට ප්‍රතිග්‍රහණය කරගන්නවාද , විශේෂයෙන්ම නීතිපති දෙපාර්තමේන්තුවෙන් පැමිණෙන -විශේෂයෙන්ම පොලීසිය සමග දීර්ඝ කාලයක් තිස්සේ ගොඩනගාගත් සබඳතා තිබෙන විනිසුරුවරුන් ඒවා කොයිතරම් දුරකට ප්‍රතිග්‍රහණය කර ගන්නවාද යන්න මත එය රඳා පවතිනවා.

***බැසිල් ප්‍රනාන්දු : නීතිපති දෙපාර්තමේන්තුව සාක්ෂි ලබාදීම ජනතාවගේ අයිතියට බලපානවා.***


***සුනිල් කුරේ :*** මං හිතන්නෙ, මට වුණත් මෙයට විරුද්ධව ක්‍රියාමාර්ගයක් ගන්න බැරිවී තිබෙනවා. මං හිතන්නෙ එය සිද්ධ වෙනකොට අපි වහාම විනිසුරු මණ්ඩලයට ප්‍රතිවාද සැපයිය යුතුයි, දිවුරුම් ප්‍රකාශයක් හෝ තමන් කියන දෙය තහවුරු කරන කිසිම ලියවිල්ලක් නැතිව අපේ එදිරිවාදී නීතීඥවරයාට කරුණු ඉදිරිපත් කරන්නට අයිතියක් නැති බවට. ඔහු කරුණු ඉදිරිපත් කළ යුත්තේ වාර්තාවට සහ ඒ මට්ටමේදී වාර්තාවේ අඩංගු වන දේ, පැමිණිලිකරු හෝ වධ හිංසාවට ලක්වූ කෙනා ගොනු කළ පෙත්සමේ අන්තර්ගතය හා වෛද්‍ය වාර්තා ආදියට සීමාවෙමින් පමණයි. මා සිතන්නේ පෙත්සම්කරුගේ නීතීඥයා වශයෙන්, ඔබ නිවැරදිව හුවා දැක්වූ පරිදි සහ අප විසින් කළ යුතු බවට දිරිමත් කළ පරිදි, එය අපේ යුතුකමක් සහ රාජකාරියක්. මං හිතන්නෙ ඒක කරන්නට අමාරු නැහැ. ඒ වගේම ශ්‍රේෂ්ඨාධිකරණයේ නීති සහ රීතිවලට සංශෝධනයක් ගෙන ඒම මගින් පවා, නීතීඥවරයා විමසන විට ඔහු තමන්ව වාර්තාවට සීමා කර ගතයුතුයි කියා විධිවිධාන සලසන්නට පුළුවන්. ඔහු තමන් කියන දෙය සම්බන්ධයෙන් දිවුරුම් ප්‍රකාශ ගොනු කර තිබෙනවා නම් ඔහුට ඒ පිළිබඳ කරුණු ඉදිරිපත් කරන්නට පුළුවන්. එහෙම නැතිනම්, ගොනු කර තිබෙන අයදුම්පතේ තිබෙන දෙයට පමණක් ඔහු තමන්ව සීමා කර ගත යුතුයි. සෑම මූලික අයිතිවාසිකම් වධ හිංසා නඩු අයදුම්පතකදීම, ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාව සහ අධිකරණ රීති සලකා බලන විට නීතිපතිවරයා අත්‍යවශ්‍ය පාර්ශවයක්. ඒ විධිවිධානයේම කියන්නට පුළුවන්, ඒ මට්ටමේදී නීතිපතිවරයා වෙනුවෙන් පෙනී සිටින රජයේ නීතීඥයා සිය කරුණු කියාපෑම් වාර්තාවට පමණක් සීමා කරගත යුතු බව.

***බැසිල් ප්‍රනාන්දු : නීතිපතිවරයා හරහා වගඋත්තකරුවන් වෙනුවෙන් ඉදිරිපත් කරන ලේඛන පෙත්සම්කරුගේ නීතීඥයාට නොපෙන්වා සිටීමේ පුරුද්දක් දැන් තිබෙනවා නේද?***

***සුනිල් කුරේ :*** ඔව්, එය සිද්ධ වෙනවා. මගේ නඩුවලින් එකකදීත් එය සිද්ධ වුණා. එය මගේ පැත්තෙන් සිදුවූ අසාර්ථකවීමක් වන්නට පුළුවන්. මා ඒ පිළිබඳ විරෝධය පා, එය වාර්තාවේ කොටසක් නොවන නිසා එය සලකා නොබැලිය යුතු යැයි කිව යුතුව තිබුණා. මා එය කළ යුතුව තිබුණා. මා දන්නෙ නෑ විනිසුරුවරුන් ගැන, ඔවුන්ට ඒ ගැන කුමක්ද කියන්නට තිබුණේ කියා. නමුත් මා සිතනවා, එය කිරීමට සහ නඩුව ගැන තීන්දුවක් ලබාදීමේදී එය නොසැලකිය යුතු බව අවධාරණය කිරීමට අසමත් වීම මගින් පෙත්සම්කරුගේ නීතීඥයා වශයෙන් මගේ රාජකාරිය මා පැහැර හැරි බව. නඩුවක් සලකා බැලිය යුත්තේ වාර්තාව මත මිස පිටින් ගෙන එන, මගේ සේවාදායකයාට නොපෙන්වන සහ උත්තරවාද සපයන්නට හෝ අදහස් දක්වන්නට ඉඩක් නැති යම්කිසි දෙයක් මත නොවෙයි. එවැනි දේ සලකා නොබැලිය යුතුයි.

***බැසිල් ප්‍රනාන්දු : ඒ කියන්නෙ, යම්කිසි ලේඛනයක් අධිකරණයට බැලීම සඳහා පමණයි කියා දෙයක් නැහැ?***

***සුනිල් කුරේ :*** සහතිකවම එවැනි දෙයක් නැහැ. ඒ වගේම එවැනි දෙයක් අතිශයින්ම අසාධාරණයි. එක පාර්ශවයකට විතරක් අනෙක් පාර්ශවයට නොපෙන්වා රහසේ කරුණු කියාපාන්නට අවස්ථාව ලැබෙනවා නම් සහ තීන්දුව ගැනීමේදී අධිකරණය ඒ මත රඳා පවතිනවා නම් එය ස්වභාවික යුක්තිය පැහැර හැරීමක්. ඒක ස්වභාවික යුක්තිය ඒකාන්තයෙන්ම පැහැර හැරීමක්.




Torture: Asian and Global Perspectives (ISSN 2304-134X (print) | ISSN 2304-1458 (online) ගෝලීය වශයෙන් වධ හිංසාව සහ ඒ හා සබැඳි ගැටලු කෙරෙහි නාභිගත වූ ද්වි මාසික සඟරාවකි. මේ විෂය සම්බන්ධයෙන් සිය පර්යේෂණ පළකරවා ගැනීමට කැමති ලේඛකයන්ට සිය ලිපි torturemag@ahrc.asia වෙත ඉදිරිපත් කළ හැක.

Photo Courtesy : http://www.supremecourt.lk/



# ලංකාවේ විනිසුරුවරුන්ටත් 'ජජයිටිස්'

# Judgeitis

**මොළ - සුෂුම්නා තරලයට විෂබීජයක් ගිය විට හැදෙන ලෙඩය මෙනින්ජයිටිස් ය. එතැනින් ගිය විට මදුරුවන් නිසා ජැපනීස් එන්කෙපලයිටිස් වැළඳේ. ආමාශයේ ගෑස් නිසා හැදෙන ලෙඩය ගෑස්ට්‍රයිටිස් ය. නමුත් මේ මොන රෝගයත් අදාළ රෝගියාගේ දේහ පටක හෝ දේහ සෛලවලට සීමා වන බව පැහැදිලි ය. සමස්ත සමාජයක්ම, රටක්ම එම එක් රෝගියෙක් නිසා ආතුර වන්නේ නැත. එහෙත් ආසියානු මානව හිමිකම් කොමිසම මේ ලිපියෙන් අවධාරණය කරන්නේ "විනිසුරුවරුන්ට හැදෙන ලෙඩය" හෙවත් 'ජජයිටිස්' ගැන ය. විනිසුරුවරුන් ආතුර වූ විට එයින් මුළු මහත් සමාජයක්ම, රටක්ම ආතුර වෙයි. නීතිය වළපල්ලට ගොස් යුක්තියේ අභාවය ඉක්මන් වෙයි.**

සැප්තැම්බර් 11 වැනිදා ද ගාඩියන් වාර්තා කළේ, විනිසුරුවරුන් ට එරෙහිව පැමිණිලි සලකා බැලීමට පෙර විනිසුරුවරුන්ගේ කල්ක්‍රියාව විමසා බැලීම සඳහා පරීක්ෂණ සභා පිහිටුවිය යුතු බවට කාලිස්ල් සාමිවරයාගේ කළ තර්කක් පිළිබඳව ය. ඔහු මේ අදහස ඉදිරිපත් කළේ ඔක්තෝබර් මස මුල සතියේ සිට විනිසුරුවරුන්ට එරෙහි පැමිණිලි විභාග කිරීමට අදාළ නව නීති රෙගුලාසි බලාත්මක වීමට නියමිත ව තිබියදී ය. එම නව රෙගුලාසි 2005 ආණ්ඩුක්‍රම ප්‍රතිසංස්කරණ පනත පදනම් කරගෙන බලාත්මක වීමට නියමිත ය. එමගින් විනිසුරුවරුන්ගේ විෂමාචාරයන් පිළිබඳ පරීක්ෂණවලදී රෙගුලාසි සෑදීමට අගවිනිසුරු සාමිවරයාට බලය ලබාදෙයි. මෑතකදී පළවූ සඟරා ලිපියට අනුව අගවිනිසුරු සාමිවරයාගේ තර්කය වූයේ විනිසුරුවරුන්ට එරෙහිව පැමිණිලි විභාග කිරීමට පෙර පරීක්ෂණ සභාවන්ට ඔවුන් ලක් කළ යුතු බවයි.



මේ පියවර මගින් ඉඟි කර සිටින්නේ ලෝකයේ ඉහළම විශ්වාසනීයත්වයෙන් යුත් අධිකරණ ක්‍රමයක් තුළ පවා යුක්තියේ පරිපාලනය පවත්වාගෙන යාම වැඩිදියුණු කිරීම පිණිස නව පියවර හා සංවාදයන් පමණක් නොව වැඩිදුර පියවර පවා ගනු ලබන බවයි. ශ්‍රී ලංකාවේ යුක්තක ක්‍රමය පැවතෙන ආකාරය අක්‍රිය වී ඇති බව ආසියානු මානව හිමිකම් කොමිසම දැන් දීර්ඝ කාලයක් මුළුල්ලේ හුවා දක්වමින් සිටියි. එය යහපත් කර ගැනීමට පියවර ගන්නවා වෙනුවට පෙනී යන්නේ සියලු පියවර මගින් අධිකරණ ක්‍රමයට සහමුලින්ම රහසින් පීඩාසිදුකරන බව ය.

ද ගාඩියන් හි පළවූ ලිපියේ කාරණයට අදාළ ව එම තත්වය 'ජජයිටිස්' යනුවෙන් හැඳින්වේ. එම යෙදුම හේල්ෂාම් සාමිවරයා විසින් මේ ආකාරයට අර්ථදක්වා තිබේ. ".... ජජයිටිස් හෝ විනිසුරුවරුන්ට හැදෙන ලෙඩයේ රෝග ලක්ෂණ වලට... පුහු සාටෝපය හෙවත් උඩඟු කම, කෝපයට සහ නොරිස්සුමට පත්වීම, වාචාල භාවය, *ඔබිටර් ඩික්ටා* (නඩුවේ තීන්දුව සඳහා වැදගත් නොවන ප්‍රකාශ) සඳහා අවනත භාවය, කෙටි මාර්ග අනුගමනය කිරීම සඳහා පෙළඹීම ඇතුළත් වේ."

"

.... ජජයිටිස් හෝ විනිසුරුවරුන්ට හැදෙන ලෙඩයේ රෝග ලක්ෂණ වලට... පුහු සාටෝපය හෙවත් උඩඟු කම, කෝපයට සහ නොරිස්සුමට පත්වීම, වාචාල භාවය, *ඔබිටර් ඩික්ටා* (නඩුවේ තීන්දුව සඳහා වැදගත් නොවන ප්‍රකාශ) සඳහා අවනත භාවය, කෙටි මාර්ග අනුගමනය කිරීම සඳහා පෙළඹීම ඇතුළත් වේ.

"




**ශ්‍රී ලංකාවේ ද 'ජජයිටිස්' හෙවත් 'විනිසුරුවරුන්ට හැදෙන ලෙඩේ' පිළිබඳව දීර්ඝ කාලයක් මුළුල්ලේ නීතීඥවරුන් අතර මෙන්ම සාමාන්‍ය ජනයා අතර ද සාකච්ඡා වී තිබේ. විශේෂයෙන්ම මෙය සිදුවූයේ හිටපු අගවිනිසුරු සරත් එන්. ද සිල්වා එම නිලයට පත්වීමෙන් පසුව ය.**

මේ විෂයට අදාළ සැලකිය යුතු ප්‍රමාණයක ශාස්ත්‍රීය ලිය කියවිලි ප්‍රමාණයක් ද තිබේ. ශ්‍රී ලංකාවේ ජජයිටිස් රෝගය යටතට ගැනෙන ලක්ෂණවලින් ඇතැමක් අපි මෙහිදී පහත පරිදි ලැයිස්තුගත කරමු.

සමහරවිට මේ රෝගයේ වඩාත්ම කැපී පෙනෙන රෝග ලක්ෂණය විධායකය සහ අධිකරණය අතර වර්ධනය වන සම්බන්ධතාවය විය යුතුය. හිටපු අග විනිසුරු අශෝක ද සිල්වා සිය විශ්‍රාම ගැනීමෙන් පසුව ජනාධිපතිවරයාගේ උපදේශකයෙකු බවට පවා පත්විය. ඔහු, අගවිනිසුරු ආචාර්ය ශිරානි බණ්ඩාරනායක දෝෂාභියෝගයෙන් බලයෙන් පහකිරීම සඳහා සහයෝගය දක්වමින් ආණ්ඩුව විසින් බෙදා දුන් පොත් පිංචක් සඳහා හැඳින්වීමේ පරිච්ඡේදය පවා ලීවේය. ජජයිටිස් වල මෙම සුවිශේෂී අංගය, සරත් එන්. සිල්වා, එවකට විධායක ජනාධිපතිනී චන්ද්‍රිකා බණ්ඩාරනායක විසින් අගවිනිසුරු ලෙස පත්වීමත් සමග ආරම්භ වූ බව පෙනේ.

- විනිශ්චයන්ට බාධා කිරීමක් වශයෙන් සමථයකට එළඹීමට උත්සාහ කිරීම. එක් පාර්ශවයක් ආණ්ඩුව හෝ ආණ්ඩුවේ නියෝජිතයෙකු වන අවස්ථාවන්හිදී මේ බව විශේෂයෙන් දැකගත හැක. සරත් එන්. ද සිලවා මෙසේ කිරීම සම්බන්ධයෙන් කුප්‍රකටව සිටි අතර යුක්තිය ඉටුකරවා ගැනීමට කැමැත්තෙන් සිටි පාර්ශවයට සමථයකට එළඹීම සඳහා බලකිරීමෙන් ඔවුන් අපේක්ෂා භංගත්වයට පත්වූ සිද්ධීන්ගේ දීර්ඝ ලැයිස්තුවක් තිබේ. නඩු උසාවියට ගෙන ඒම වෙනුවට ඒවා ආණ්ඩුවේ දෙපාර්තමේන්තුවලදීම විසඳා ගන්නා ලෙසට වත්මන් අගවිනිසුරු මොහාන් පීරිස් ද විවෘත අධිකරණයේදී නීතීඥවරුන්ට යෝජනා කළ බවට වාර්තා තිබේ.




- ජ්‍යෙෂ්ඨ නීතීඥ එස්.එල්. ගුණසේකර සිය *Lore of the Law and Other Memories* ග්‍රන්ථයේදී ශ්‍රී ලංකාවේ ඉතා සුලබව සිදුවන සහ ජජයිටිස් යටතට පහසුවෙන් ගත හැකි අක්‍රමිකතා ගණනාවක් සඳහන් කරයි. ඔහු සඳහන් කරන එවන් එක් සුලබ පරිචයක් වන්නේ නීතීඥයන්ව නිසි ලෙස ශ්‍රවණය කිරීමට විනිසුරන් අපොහොසත් වීමයි.

- LST Review හි මෑතකදී (306 සහ 307 කාණ්ඩ, 2013 මැයි) නැවත පළ කළ නීතීඥවරුන් කණ්ඩායමක් විසින් සිදුකළ ප්‍රකාශයක් මගින් ජජයිටිස්

යටතට ගත හැකි දීර්ඝ ලැයිස්තුවක් දැක්වෙයි. මූලික අයිතිවාසිකම් නඩුවලදී වගඋත්තරකරු උසාවියේ කිසිදු පිළිතුරක් ගොනු කිරීමට පෙර, එකී වගඋත්තකරුවන් වෙනුවෙන් නීතිපති දෙපාර්තමේන්තුවේ නීතීඥයන්ට වාචික කරුණු කියාපෑම් සිදුකිරීමට ඉඩ ලබාදීම, මූලික අයිතිවාසිකම් අයදුම්පත් විභාගයට ගැනීමට ඉඩ ලබානොදෙමින් ඒවා නිෂ්ප්‍රභා කිරීමේදී සහ ඉහළ අධිකරණවලට අභියාචනා කිරීමට ඉඩ ලබාදීම ප්‍රතික්ෂේප කරමින් අධිකරණය විසින් හේතු නොදැක්වීම, මිනීමැරුම හා ස්ත්‍රී දූෂනය වැනි ඉතා බරපතළ අපරාධ සඳහා පවා අත්හිටවූ දඬුවම් ලබාදීම (ස්ත්‍රී දූෂකයන්ට සහ ලිංගික අපචාර සඳහා වරදකරුවන් වූවන් ට අත්හිටවූ දඬුවම් ලබාදීමට එරෙහිව කාන්තා සංවිධාන විසින් මහජන උද්ඝෝෂණ ද පවත්වන්නට යෙදිණ), පුද්ගලික හේතු මත නීතීඥවරුන් ට තාඩන පීඩන සිදුකිරීම, ඇතැම් විනිසුරුවරුන්ගේ පැත්තෙන් නීතිය පිළිබඳ ප්‍රමාණවත් දැනුමක් නොමැති වීම, විනිසුරුවරුන් විසින් කිසිදු හේතුවක් නොමැතිව නීතීඥවරුන්ට දොස් පැවරීම, උදාහරණයක් වශයෙන්, දීර්ඝ කාලයක් මුළුල්ලේ නීතීඥ වෘත්තියේ යෙදී සිටින සහ පිරිසිදු වාර්තාවක් සහිත එක්තරා ජ්‍යෙෂ්ඨ නීතීඥවරයෙකු හට ශ්‍රේෂ්ඨාධිකරණය, විවෘත අධිකරණයේදී චෝදනා කර තිබුණේ ඔහු බොරුකාරයෙකු ය කියමිනි. මෙය, අධිකරණයට ඉදිරිපත් කළ ලිපි ලේඛනවලින් එකක් ව්‍යාජ එකක් යැයි විනිසුරුවරයාගේ දුරාවබෝධයක් හේතුවෙන් සිදුවූවක් විය. එය වැරදි අවබෝධයක් බවට පසුව අධිකරණයේදීම ඔප්පු කරන ලදී.

මෙවැනි ජජයිටිස් හි අංගයන් සඳහා දීර්ඝ ලැයිස්තුවක්ම ඉදිරිපත් කිරීමට පුළුවන. පරීක්ෂණ සභාවක් සම්බන්ධයෙන් එක්සත් රාජධානියේදී සිදුකරනු ලැබූ යෝජනා සහ 2005 ආණ්ඩුක්‍රම ව්‍යවස්ථා ප්‍රතිසංස්කරණ පනත යටතේ, විනිසුරුවරුන්ට එරෙහිව ඉදිරිපත් වන පැමිණිලි සඳහා නව රෙගුලාසි පැනවීම ඇතුළු එවැනි වෙනත් පියවර ශ්‍රී ලංකාවේ ද ඇඩි අවශ්‍යතාවයකි. කෙසේ නමුත්, අධිකරණය සිය පාලනය යටතට ගැනීම සඳහා විධායකය විසින් යොදනු ලබන ප්‍රබල පීඩනය හමුවේ ඒ බව තවම වටහාගෙන නැත්තා සේ පෙනේ. ආණ්ඩුවේ ශාඛා ත්‍රිත්වයට සහයෝගයෙන් වැඩ කිරීමට යෝජනා කරමින් ඩී ෆැක්ටෝ අගවිනිසුරු මොහාන් පීරිස් පසුගියදා සිදුකරන ලදැයි මාධ්‍යවල පළවූ ප්‍රකාශය පවා බලතල බෙදීමට බරපතළ ලෙස හානි කිරීමකි. අගවිනිසුරු ආචාර්ය ශිරානි බණ්ඩාරනායක දෝෂාභියෝගයෙන් ඉවත් කිරීම සම්බන්ධයෙන් අන්තර්ජාතික විශේෂඥයන් විසින් සිදුකළ අදහස් දැක්වීම් ද එබඳු පීඩාකිරීමක් පිළිබඳ තවදුරටත් ඉඟි කර සිටියි.

**මෙවැනි ජජයිටිස් හි අංගයන් සඳහා දීර්ඝ ලැයිස්තුවක්ම ඉදිරිපත් කිරීමට පුළුවන.**


**ආණ්ඩුවේ ශාඛා ත්‍රිත්වයට සහයෝගයෙන් වැඩ කිරීමට යෝජනා කරමින් ඩී ෆැක්ටෝ අගවිනිසුරු මොහාන් පීරිස් පසුගියදා සිදුකරන ලදැයි මාධ්‍යවල පළවූ ප්‍රකාශය පවා බලතල බෙදීමට බරපතළ ලෙස හානි කිරීමකි.**

**අගවිනිසුරු ආචාර්ය ශිරානි බණ්ඩාරනායක දෝෂාභියෝගයෙන් ඉවත් කිරීම සම්බන්ධයෙන් අන්තර්ජාතික විශේෂඥයන් විසින් සිදුකළ අදහස් දැක්වීම් ද එබඳු පීඩාකිරීමක් පිළිබඳ තවදුරටත් ඉඟි කර සිටියි.**




# A book that tells the story of human tragedy

# ශ්‍රී ලංකාවේ **මානව බේදවාචකයේ කතාන්දරය** පවසන ග්‍රන්ථයක්




**Narrtive of Justice in Sri Lanka**

told through stories of torture victims



එරාන් වික්‍රමරත්න විසිනි.

පහත දැක්වෙන ග්‍රන්ථ විචාරය
Torture: Asian and Global Perspectives
http://www.humanrights.asia/resources/journals-magazines/torture-asian-and-global-perspectives හි
මුල්වරට පළ විය.

බැසිල් ප්‍රනාන්දුගේ මනා ලෙස පර්යේෂණ කිරීමෙන් පසුව පළ කර තිබෙන ලේඛන එකතුව, 1998 දක්වා ආපස්සට දිවයමින්, පුද්ගලික ආරක්ෂාව සහ අභිමානය අපරාධ යුක්තික ක්‍රමය තුළ ප්‍රේෂණය කිරීම කෙරෙහි රාජ්‍ය යාන්ත්‍රණය දක්වන කැමැත්තේ ඛේදනීය කතාන්දරයක් කියාපායි. එහි සඳහන් සිද්ධි විශාල සංඛ්‍යාවකින් විසන්ධි වූ සිරුරු, පුළුල් ලෙස පැතිර පවත්නා ලිංගික අඩන්තේට්ටම්, බලහත්කාරයෙන් සාගින්නේ තැබීම සහ වෛද්‍ය ප්‍රතිකාර ලබාදීම යළි යළිත් ප්‍රතික්ෂේප කිරීම පිළිබඳ බිහිසුණු චිත්‍රයක් ඇඳ තබයි. වඩාත්ම වැදගත් දෙය, වාර්තාගත කර තිබෙන මේ සිදුවීම් වසර 15 කට අධික කාලයක් පුරා පැතිරුණු ඒවා වීමයි. සෑම කතාන්දරයකින්ම නැවත නැවතත් සමානකම් පුනරුච්ඡාරණය කෙරෙයි. බොරු, කල්පිත හෝ නිස්සාර චෝදනා නගා පුද්ගලයන් අත්අඩංගුවට ගැනෙන අතර ඉන්පසු ක්‍රමය මෙහෙයවන්නන්ගේ දෑත් තුළ ප්‍රචණ්ඩ සහ කුරිරු සැලකීම්වලට ලක්වෙති. ඔවුන් එය සිදුකරන අවස්ථාවලදී, සිදුවූ අයුක්තියට වගවීම සිදුවන්නේ ඉතා කලාතුරකිනි. තවද අපහරණයන් සිදුකළ පොලීසිය ට එල්ල වන අභියෝග නිතරම පාහේ නිශ්ශබ්ද කෙරේ. මෙය සිදුවනුයේ අධිකරණ පද්ධතියේ අයුතු පමාව හෝ එයට බාහිරව ත වතවත් ප්‍රචණ්ඩත්වය යෙදවීම සඳහා තර්ජනය කිරීම මගිනි.

වධ හිංසා වින්දිතයෝ සහමුලින්ම පාහේ සමාජයේ දුප්පත් සහ කොන්වූ අය වෙති. අධ්‍යාපනය, ධනය, හෝ දේශපාලන සබඳතා අඩුකම විසින් වින්දිතයා අවදානම්වලට පහසුවෙන් ලක් වන්නෙක් බවට පත්කරයි. වධ හිංසාවට විරෝධය පෑම සඳහා වින්දිතයාගේ හැකියාව සහ බොරු චෝදනාවලට එරෙහිව සටන් වැදීමේ හැකියාව අවමයක් වන අතර, එයින් ඔවුහු අසාධාරණ ක්‍රමයක පහසු ගොදුරු බවට පත්වෙති.



සත්‍ය වශයෙන්ම අපේ අපරාධ යුක්තික ක්‍රමය එහි වින්දිතයන්ව දෙවරක් අසමත් කරන්නා සේ පෙනේ. ඒ, අපගේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ මූලික අයිතිවාසිකම් උල්ලංඝනය කිරීම සඳහා අපරාධකරුවන් වරදකරුවන් කිරීමෙන් වළක්වා ඔවුන්ව ආරක්ෂා කිරීම මගින්, භ්‍රාන්ත වූ සමාජයක අපට ජීවත් වන්නට ඉඩ හැරීමෙන් සහ ප්‍රජාතන්ත්‍රවාදය හා සඵල විචාරය සඳහා වන අවකාශයන් හකුළුවාලීම මගිනි. වධ හිංසාවෙන් මිදීම සඳහා වන අයිතිවාසිකම මූලික හා විශ්වීය එකකි. එක්සත් ජාතීන්ගේ ප්‍රකාශනය, වධ හිංසාව සහ වෙනත් කෲර, අමානුෂික හෝ අවමන් සහගත සැලකිලි හෝ දඬුවම්වලට එරෙහි සම්මුතිය සහ 1994 අංක 22 දරණ ශ්‍රී ලංකාවේම වධ හිංසා පනත මගින් නිදහස් මිනිසෙකු ලෙස වධ හිංසාවන්ට ලක් නොවී ආරක්ෂිත පරිසරයක ජීවත් වීමේ නෛතික අයිතිය පුද්ගලයෙකු හට තිබෙන බව පිළිගනියි. වධ හිංසාවෙන් නිදහස් වීමේ අයිතිය අපේ අවධානය සඳහා සුදුසු වන්නේ එම අයිතිය අවලංගු වීම අපගේ මනුෂ්‍යත්වයේ සකල නිර්මිතය ම සෝදාපාළුවට ලක්කරන බවට තර්ජනය කරන හෙයිනි. නිල වශයෙන් සිදුකරන වධ හිංසාව සඳහා රජය සම්බන්ධ බවට වන කරුණ ගැන සැකයක් නැත. මෑත කාලයේදී චීනය, නයිජීරියාව, පාකිස්ථානය ආදී රටවල් වලින් ද රජය විසින් වධ හිසාවන් සිදුකළ බවට නිදර්ශන ගණනාවක් අප අසා තිබේ. කෙසේ නමුත්, ආශ්‍රිත කරුණු කෙසේ වුවත්, සියලු රාජ්‍යයන් එය වැරදි යැයි විශ්වාස කරන බව අවධාරණය කිරීම වටියි. වධ හිංසාවට සම්බන්ධ සියල්ලෝම එය බලගතු ලෙස ප්‍රතික්ෂේප කරති. තමන්ගේ පුරවැසියන් වධ හිංසාවට ලක්කිරීමේ අයිතිය සාධාරණීකරණය කිරීම සඳහා කිසිදු රාජ්‍යයක් 'ස්වාධිපත්‍යය' යොදාගන්නේ නැත.

කිසිම පොලිස් නිලධාරී පුද්ගලයෙකු වධ හිංසා ක්‍රියාවන්ගේ නොයෙදෙන - සම්පූර්ණයෙන්ම නිදහස් සමාජයක් අපට බලාපොරොත්තු විය හැකි යැයි උපකල්පනය කිරීම ඇතැම්විට අතාත්වික දෙයක් වන්නට පුළුවනි. එසේ වුවත්, පුද්ගලයාට මේ ක්‍රමය අසාර්ථක කළ හැකි බව තහවුරු කිරීම අපේ රාජකාරියයි. ක්‍රමය, පුද්ගලයාව අසාර්ථක කරන්නේ නැත.

මේ වධ හිංසා සිදුවීම් වාර්තාගතකරණයෙන් පෙනී යන පරිදි, සාක්ෂිකරුවන් ආරක්ෂා කිරීමේ වැඩසටහනක් ක්‍රියාවට නැංවීම සඳහා වන අකමැත්ත, අත්තනෝමතික අත්අඩංගුවට ගැනීම්, උසාවි මට්ටමේදී විසමානුපාතික

ප්‍රමාදයන්, සිය විධිනියෝගයන් යටතේ ක්‍රියාකිරීම සඳහා ජාතික මානව හිමිකම් කවුන්සිලයට පිරිනමා තිබෙන බලයේ අඩුපාඩු සමග එක්වූ සෑම තැනම පිසදා පැතිර තිබෙන දේශපාලන අනුග්‍රාහකත්වය විසින් සමථකාරී ක්‍රමයක් පුළුල් අපහරණයකට විවෘත කර තිබේ. මෙහි ප්‍රතිඵලයක් ලෙස, නිල වධ හිංසාව ඉවසා දරාගත යුතු බවට පමණක් නොව එය දිරිමත් වනු ඇති බවටත් වන ගැටලුකාරී (අ)යුක්තියේ කතාන්දරයක් ඉතිරි වෙයි. සැබවින්ම එය, කාලයක් තිස්සේ බන්ධනාගාර බිත්ති තුළින් කාන්දු වී ශ්‍රී ලංකා සමාජයේ මනෝවිභීතිය තුළට විශාල වශයෙන් තෙත බැස තිබෙන කතාන්දරයකි. ඒවා මගින් නීතියේ ආධිපත්‍යයේ වඩාත්ම දෘෂ්‍යමාන ස්ථම්භය නියෝජනය කරනා බැවින් පොලිස් බලකාය අතර වධ හිංසාව පැතිර පැවතීම, සාමාන්‍ය ජනතාවගේ ජීවිතවල යථාර්ථයෙන් නීතියේ පවිත්‍රතාවය අවතැන් කිරීමට විශාල වශයෙන් දායක වනු ඇත.

මේ අනුව ප්‍රතිසංස්කරණ රඳා පවතින්නේ නීතිය පිළිබඳ මහජන විශ්වාසය නැවත ඇති කිරීම සහ ශ්‍රී ලංකා පුරවැසියන් සුරක්ෂණය කිරීම සඳහා එහි ප්‍රතිඵලයක් ලෙස ඇතිවන හැකියාව තුළ ය. රැකවරණ භාරයේ සිටින පුද්ගලයන් සමග පොලීසිය, ඔවුන් නිර්දෝෂීද වැරදිකරුවන් ද යන්න නොකතා අන්තර්ක්‍රියා දක්වන ආකාරය, පශ්චාත් යුධ ශ්‍රී ලංකාවේ සාමය සහ යුක්තිය වැඩිදියුණු කිරීමේ නව මාර්ගයක් විදහා දක්වන බව පෙනේ.

The narrative of justice told through stories of torture victims ග්‍රන්ථය අසාර්ථක වූ ක්‍රමයක් පිළිබඳ ශාස්ත්‍රීය කතාන්දරයක් නොවේ. එය අපේ රටේ පුරවැසියන්ගේ දෛනික ජීවිතය ගෙන හැර දක්වන මානව ඛේදවාචකයේ කතාන්දරයයි. වධ හිංසාව සමාජ උවදුරකි. එහි පැවැත්ම සඳහා හේතුවන කිසිදු ඉවසා දරා සිටීමේ සීමාවක් තිබිය නොහැකිය. වධ හිංසාවෙන් තොර වූ ලෝකයක් පිළිබඳ සංකල්පය අප වැළඳගත යුතුය. වින්දිතයන්ගේ කතාන්දරය කියවන විට කෝපය මෙන්ම අනුකම්පාව ද ඇතිවේ. බැසිල් ප්‍රනාන්දුගේ විශ්ලේෂණය අපව ප්‍රතිසංස්කරණ සඳහා වන පරම අවශ්‍යතාවය වෙත මෙහෙයවයි.

> " **The narrative of justice told through stories of torture victims ග්‍රන්ථය අසාර්ථක වූ ක්‍රමයක් පිළිබඳ ශාස්ත්‍රීය කතාන්දරයක් නොවේ. එය අපේ රටේ පුරවැසියන්ගේ දෛනික ජීවිතය ගෙන හැර දක්වන මානව ඛේදවාචකයේ කතාන්දරයයි. වධ හිංසාව සමාජ උවදුරකි. එහි පැවැත්ම සඳහා හේතුවන කිසිදු ඉවසා දරා සිටීමේ සීමාවක් තිබිය නොහැකිය.** "

අප විසින් පොලීසිය හමුදාමය ආයතනවලින් අසම්බන්ධිත කළ යුතුය. ශ්‍රී ලංකාවේ පොලීසිය හා හමුදාව අතර තිබෙන හරස් බැඳීම් විසින් අභ්‍යන්තර සාමය හා බාහිර ආරක්ෂාව අතර සීමාවන් අපැහැදිලි කිරීමට හේතු වී තිබේ. මෙමගින්, සිවිල් අකීකරුතාවයේ සෑම අවස්ථාවක් ම පාහේ බලය අයුතු ලෙස යෙදවීමට ඉඩ සලසන 'බාහිර තර්ජන' ලෙස අමුතුවෙන් සැලකීමට ඉඩ ප්‍රස්ථා සලසා තිබේ. තවද අප විසින් පොලීසිය නැවත ශිෂ්ටත්වයට පත් කළ යුතුය. පිරිසිදු පානීය ජලය ඉල්ලා සිටි වැලිවේරිය නිරායුධ ජනතාවට පසුගියදා එල්ල වූ හමුදා ප්‍රහාරය, පොලීසිය හා හමුදා සටන් අතර පැහැදිලි වෙනසක් තිබිණි නම් වළක්වාගත හැකිව තිබුණේය. සෑම පොලිස් නිලධාරියෙක්ම ස්වකීය 'මානව හිමිකම් වාර්තාව' මත පදනම් ව පරීක්ෂාවට ලක්කිරීමේ ක්‍රමවේදයක් තිබිය යුතු අතර වධ හිංසා හෝ අමානුෂික/අවමන් සහගත සැලකිලිවලට අදාළ ක්‍රියාවන් සිදුකළ බව සොයාගතහොත් එම පොලිස් නිලධාරීන් සේවයෙන් පහ කළ යුතුය. වරදකරුවන් ට හුදෙක් ස්ථානමාරු ලබාදීමෙන් අදහස් වන්නේ වරදකට ඉවසා සිටීමයි.

වඩා වෘත්තීය පොලිස් බලකායකට අඩු ආදායම් නිසා නිරන්තරයෙන් හටගන්නා පීඩනවලට ඔරොත්තු දිහ හැකි පරිදි මනා වැටුප් ලබාදිය යුතුය. පොලිස් නිලධාරීන් පුහුණු කිරීම සඳහා විශාල බරපැනක් යෙදවිය යුත්තේ ඔවුන් නීතියේ හා යුක්තියේ ආරක්ෂකයන් හා ප්‍රවර්ධකයන් ය යන අදහසින් මිස ආරක්ෂාව බලාත්මක කරන්නන් යන අදහසින් නොවේ. වධ හිංසාව මගින් ලබාගන්නා පාපොච්ඡාරණවලට වඩා ආශ්‍රිත කරුණු මත පදනම් ව අභිචෝදනයන් සිදුකිරීමේ හැකියාව වැඩිදියුණු කිරීමට අවශ්‍ය වන තාක්ෂණය හා යන්ත්‍රසූත්‍ර සඳහා වැඩි ආයෝජනයක් සිදුකිරීම ද හොඳ පුහුණුවක් ඌනපූරණය කිරීමට හේතු වනු ඇත.

කතුවරයා පිළිබඳ මත දැක්වීමක් සිදුනොකළහොත් මේ ග්‍රන්ථය පිළිබඳ මගේ මත දැක්වීම අසම්පූර්ණ වනු ඇත. මා බැසිල් ප්‍රනාන්දු මුණගැසී තිබෙන්නේ එක් වරක් පමණි. මෙහෙවරක යෙදී සිටින මිනිසෙකු වශයෙන් ඔහු මගේ සිතේ ප්‍රබල-ඒකාන්ත හැඟීමක් ඇති කළේය. කොන් වූවන්, අයුක්තියේ වින්දිතයන් සහ විශේෂයෙන්ම වධ හිංසාවන් ට හා අවමන් සහගත, අමානුෂික සැලකිලිවලට භාජනය වන්නන් වෙනුවෙන් සටන් වැදීම ඔහු තුළට ආත්මගත වී තිබේ. මේ කාර්යය සඳහා ඔහු කරන කැපවීම විසින් නියත වශයෙන්ම ඔහු ධනවතෙකු කර නැත. ඒ වෙනුවට සිදුවී තිබෙන්නේ, ඔහු උපන් බිම-ශ්‍රී ලංකාව තමන්ව සතුටින් පිළිනොගන්නා බව දැනී යාම නිසා ඔහු සිය මිතුරන් හා ඥාතීන්ගෙන් දුරස් වීමයි. අන් අයගේ න්‍යායපත්‍රයන් ට වැඩකරනා කුලීකාරයන් නොව උතුම් අරමුණක් ලුහුබැඳ යන බැසිල් ප්‍රනාන්දු වැනි පරමාදර්ශීන් නිසා අපේ රට පොහොසත් වෙයි. ඔහුගේ දර්ශනය, චින්තනය, සාරධර්ම ප්‍රතිපත්ති සහ ඔහුගේ ජීවන රටාව, ඔහුගේ මේ නව ප්‍රකාශනය ට පිටුපසින් උස්ව නැගී සිටියි.

**"කතුවරයා පිළිබඳ මත දැක්වීමක් සිදුනොකළහොත් මේ ග්‍රන්ථය පිළිබඳ මගේ මත දැක්වීම අසම්පූර්ණ වනු ඇත. මා බැසිල් ප්‍රනාන්දු මුණගැසී තිබෙන්නේ එක් වරක් පමණි. මෙහෙවරක යෙදී සිටින මිනිසෙකු වශයෙන් ඔහු මගේ සිතේ ප්‍රබල-ඒකාන්ත හැඟීමක් ඇති කළේය. කොන් වූවන්, අයුක්තියේ වින්දිතයන් සහ විශේෂයෙන්ම වධ හිංසාවන් ට හා අවමන් සහගත, අමානුෂික සැලකිලිවලට භාජනය වන්නන් වෙනුවෙන් සටන් වැදීම ඔහු තුළට ආත්මගත වී තිබේ. මේ කාර්යය සඳහා ඔහු කරන කැපවීම විසින් නියත වශයෙන්ම ඔහු ධනවතෙකු කර නැත. ඒ වෙනුවට සිදුවී තිබෙන්නේ, ඔහු උපන් බිම-ශ්‍රී ලංකාව තමන්ව සතුටින් පිළිනොගන්නා බව දැනී යාම නිසා ඔහු සිය මිතුරන් හා ඥාතීන්ගෙන් දුරස් වීමයි. අන් අයගේ න්‍යායපත්‍රයන් ට වැඩකරනා කුලීකාරයන් නොව උතුම් අරමුණක් ලුහුබැඳ යන බැසිල් ප්‍රනාන්දු වැනි පරමාදර්ශීන් නිසා අපේ රට පොහොසත් වෙයි. ඔහුගේ දර්ශනය, චින්තනය, සාරධර්ම ප්‍රතිපත්ති සහ ඔහුගේ ජීවන රටාව, ඔහුගේ මේ නව ප්‍රකාශනය ට පිටුපසින් උස්ව නැගී සිටියි."**

ජනතාව සිය ආණ්ඩුවට බිය වන නොව ආණ්ඩුව සිය ජනතාවට බිය වන රටක-විවෘත සමාජයක් පතන-විවෘත මනසක් සහිත ජනයා මේ පොත කියවිය යුතුම යැයි මම ප්‍රබල ලෙස නිර්දේශ කරමි.

(එරාන් වික්‍රමරත්න ශ්‍රී ලංකා පාර්ලිමේන්තුවේ සාමාජිකයෙකි)



# බරණැස් නුවර අබ මල් දුටිමි



**දන්නා ඉතිහාසය තුළ මේ ලෝකයේ ප්‍රථමයෙන් ම මනුෂ්‍ය සමානාත්මතාවය සහ මානව හිමිකම් පිළිබඳ දෙසා වදාළ ආගමික ශාස්තෘවරුන් අතරින් බුදුන් වහන්සේ ට හිමිවන්නේ අග්‍රස්ථානයකි. පහත දක්වෙන්නේ ඒ බව සොයා ගිය බැසිල් ප්‍රනාන්දු මහතාගේ බරණැස් නුවර සංචාරක සටහනකි.**

බරණැස් නුවර වාරණාසී නමින් හැඳින්වේ. සිංහල මාධ්‍යයෙන් අධ්‍යාපනය ලැබූ කාටත් බරණැස් නුවර බ්‍රහ්මදත්ත නම් රජකෙනෙකු පිළිබඳ වචන පුරුදු ය. බරණැස් නුවරට මුල් වරට කරන ගමනක් යම් බලාපොරොත්තුවක් හා උනන්දුවක් ඇති කරනුයේ ඒ නිසා විය යුතුය.

මා බරණැස් නුවරට ළඟා වූයේ වන්දනා ගමනක් සඳහා නොවේ. මගේ වැඩකටයුතුවලට සම්බන්ධ පුද්ගලයන් හමුවීමට ය. එහි ගුවන්තොටුපොළේදී ඉන්දීය ජාතික ආචාර්ය ලෙනින් මා පිළිගැනීමට පැමිණ සිටියේය. ඔහුගේ පියා පෙර පරම්පරාවේ කොමියුනිස්ට්වාදියෙකු විය. කොමියුනිස්ට් අදහස් ඔහුට තිබූ උනන්දුව අනාගතයේ පවත්වාගෙන යාමේ අදහසින් ඔහු තම දරුවන් ලෙනින්, ස්ටාලින්, මාවෝ හා කැස්ත්‍රෝ යන නම්වලින් හැඳින්වීය. ඔවුන්ගේ පවුල අයිති කුලය 'ඨාකූර්' යනුවෙන් හඳුන්වන වාරණාසියේ ඉතාම බලවත් කුලයයි. ඨාකූර් කුලයට අයත් වූවන් තුවක්කුවෙන් ගනුදෙනු කරන්නන් ලෙස හඳුන්වාගනු ලැබේ. ආයුධ පාවිච්චිය මගින් තමන්ගේ අයිතීන් රැක ගැනීම පාරම්පරික අයිතියක් සේ ඔවුහු සලකති.

ඔවුන්ට අයිති, තරමක් විශාල කොටුවක ආකාරයෙන් නිර්මාණය කර තිබූ ගෙය, සහෝදරයන් අතරද බෙදා දී මව්පිය දෙපළ ද එහි ජීවත් වෙති. එහි එල්ලා ඇති විශාල රූප අතර ලෙනින් හා ස්ටාලින්ගේ රූප මෙන්ම තවත් ඉන්දීයයන් ගණනාවකගේම රූප ද දුටිමි. ඒවා කාගේදැයි ඇසූ විට පිළිතුර වූයේ, බ්‍රිතාන්‍යයන් විසින් එල්ලා

මරණ ලද තමන්ගේ ඥාතීන්ගේ රූප බව ය. එම ඥාතීන් හා නිදහස් අරගලය අතර තිබූ සම්බන්ධය පිළිබඳ ගෞරවපූර්වක මතයක් එසේ පවත්වාගෙන යනු ලැබේ.

ඨාකුර් කුලයේ අයගේ ගතිගුණ පිළිබඳ ලෙනින් විස්තර කරන්නේ සමාජ විද්‍යාත්මක දත්තයක් විස්තර කරදීමට උත්සාහ කරන්නෙකු ලෙස ය. ඔහු තමන්ගේ හැදියාව දෙස විවේචනශීලීව බලයි. කුඩා කල අම්මාගෙන් ලබා තිබූ උපදේශය වූයේ, කිසියම් හෝ කොල්ලෙකුගෙන් ගුටි කා ගෙදර පැමිණියහොත් ගෙදරින් ඔහුට කෑම නොලැබෙන බව ය. ගුටි කෙළියකදී දිනා පැමිණිය යුතු බව මෙසේ ඨාකුර් කුලයේ ළමයින්ට උගන්වනු ලබයි. ඨාකුර්වරුන් අතර වාද විවාද විසඳාගනු ලබන්නේ තුවක්කු පාවිච්චිය මගිනි. ඨාකුර්වරුන් පළිගන්නා ආකාරය අවුරුදු දාහතර දක්වා දික්විය හැකි ආකාරය ගැන ජන කතාවක් ද තිබේ.

එවැනි පසුබිමකින් පැමිණි ආචාර්ය ලෙනින් දැන් බොහෝ දුරට වෙනස් වූ පුද්ගලයෙකි. බී.ආර්. අම්බෙත්කාර්ගේ කෘතීන් කියවීම මගින් ඉන්දියාව පිළිබඳ වඩා වෙනස් අවබෝධයක් කරා ළඟා වූ බව ඔහු කියයි. ඔහු අම්බෙත්කාර්ගේ අනුගාමිකයන් විසින් ඉන්දියාවේ ඇති කරන ලද බෞද්ධ ව්‍යාපාරයේ සාමාජිකයෙකි. 'දලිත්' යනුවෙන් හඳුන්වනු ලබන, ස්පර්ශයට නුසුදුස්සන් යැයි වර්ග කර තිබූ විශාල ජන කොටස තුළ ඔවුන්ගේ විමුක්තිය සඳහා අරගලයේ කොටසක් වශයෙන්, ඉන්දීය කුල ක්‍රමයට පදනම සැලසූ බ්‍රාහ්මණ මූලධර්මයන්ගෙන් ඉවත් විය යුතු බවත්, එම මූලධර්මයන්ට පදනම සැලසූ 'වේද' ග්‍රන්ථ පිළිබඳ විශ්වාසය අත හැර දැමිය යුතු බවත් අම්බෙත්කාර්ගේ දර්ශනයේ හරය ලෙස පැවතියේය. මුල් යුගයේ බුදු දහම, බ්‍රාහ්මණ ආධිපත්‍යය බිඳ දැමූ මහා පරිමාණ ජන ව්‍යාපාරයක් වූ බවත් ඒ තුළින් සමානාත්මතාවය, සහෝදරත්වය සහ නිදහස ඉන්දියාව පුරා පතළ වූයේ බුදු දහමේ ආභාසය යටතේ බවත් අම්බෙද්කාර් තම ගවේෂණ මගින් ඉදිරිපත් කළේය. 1956 දී අම්බෙත්කාර් ලක්ෂ පහක පමණ විශාල ජනකායක් සමග බුදු දහම වැළඳ ගත්තේ 'මම හින්දු භක්තිකයෙකු ලෙස උපන් නමුත් එසේ මිය නොයන බව" ට ඊට අවුරුදු විස්සක පෙර කර තිබූ ප්‍රතිඥාවකට අනුව ය. මෙසේ බුදු දහම වැළඳගැනීම මගින් අතිවූ නව බෞද්ධ ව්‍යාපාරය තවමත් ඉතාමත් ප්‍රායෝගිකව සහ සංවිධානාත්මකව පවතියි. එම සංවිධානය තුළ සංඝයා වහන්සේලා සිටින්නේ ටික දෙනෙකි. එය මූලිකවම ගිහි ව්‍යාපාරයකි. බ්‍රාහ්මණයාගේ ආධිපත්‍යය පළජක සිරිත් විරිත් හා වරප්‍රසාද ඇති කර ගැනීම මගින් සිදුවූ බවට මෙම ව්‍යාපාරය තුළ මුල් බැස ඇති සිද්ධාන්තය නිසාම එවැනි පූජක පෙළපතක් තම බෞද්ධ ව්‍යාපාරය තුළ ඇති නොවිය යුතු බවට ගැඹුරු එකඟතාවයක් ඔවුන් තුළ ඇත. එම නිසා සාමාජිකයන් බඳවා ගැනීමේදී ක්‍රමවත් පිළිවෙතක් අනුගමනය කෙරෙන බව ආචාර්ය ලෙනින් මට විස්තර කළේය. එමෙන්ම බුදු දහම රූප වන්දනාවක් බවට හැරවීම වැළැක්වීමටත් බ්‍රාහ්මණයන්ගේ දෙවිවරුන් පස්සා දොරින් හෝ තම සංවිධානය තුළට ඇතුළු වීම වැළැක්වීමටත් ඔවුහු පියවර ගනිති. ආචාර්ය ලෙනින් බෞද්ධයෙකු වී ටික කලකට පසු, ඔහුගේ ඉතා දැඩි හින්දු භක්තිකයෙකු වූ බිරිඳ ද ඔහු අනුගමන කරමින් බෞද්ධයෙකු වූවා ය. එසේ වූයේ කිසියම් ම හෝ බලපෑමකින් නොව ඇය තුළම ඇතිවූ විවේචනශීලී භාවය හා බුද්ධිමය වර්ධනය නිසා බව ඔහු කියයි. ඨාකුර් කුලයේ පිරිමින් පුරුෂාධිපත්‍යයට බොහෝ සේ හුරු වී ඇති බවත් එම හුරු පුරුදු



පුරාණ ඉන්දියාව කුල ක්‍රමය ඔඩු දුවා තිබූ දේශයකි

කම්වලින් මිදීමට තමාට ද බොහෝ කාලයක් ගතවූ බවත් ඔහු කියයි. දැන් ඔහුගේ බිරිඳ වන ශ්‍රැතී, ඔහුටත් වඩා පිළිගැනීමට ලක් වී ඇති නායිකාවකි.

ආචාර්ය ලෙනින් වැඩකරන ක්ෂේත්‍ර වන්නේ පෙර ස්පර්ශයට නුසුදුස්සන් ලෙස සැලකූ දලිත්වරුන්ගේ උප කුල ගණනාවක් සමගත්, ආහාර හිඟය නිසා කරදරයට ලක්ව ඇති කණ්ඩායම් අතරත්, දරිද්‍රතාවයෙන් පෙළෙන වනිතා කණ්ඩායම් අතර හා පොලීසියේ ම්ලේච්ඡකම් නිසා ඉතා දැඩි අර්බුදයට පත් වී තිබෙන ඉන්දියාවේ අපරාධ පරීක්ෂණ ක්‍රමය වෙනස් කර ගැනීම සඳහා කටයුතු කරන්නන් සමගත් ය.

මීයන් අල්ලා ආහාරයට ගන්නා කණ්ඩායමක් ලෙස සලකනු ලබන උපකුලයේ කණ්ඩායමක් සඳහා සංවිධානය කර තිබූ, ඉන්දියාවේ මුල්වරට පවත්වනු ලබන ජන පාසලට මම සහභාගී වීමි. ඒ සඳහා පහළොවක් පමණ පිරිමින් ද ස්ත්‍රීන් හත් දෙනෙක් පමණ ද සහභාගී වූහ. රැස්වීම පටන් ගෙන ඉතා සුළු කාලයක් තුළ මෙම දරිද්‍රතාවයේ උපරිම පීඩනයට ලක් ව සිටින්නෝ නොපැකිළ කතා කිරීමට පටන් ගත්හ. ඔවුහු තමන් මුහුණ දෙන ගැටලු ගැන කතා කළහ. ආහාර නැති කම නිසා මියගිය දරුවන් ගැන ද කතා කළෝය. ණය ගෙවා ගැනීමට නොහැකි වූ නිසා අවුරුදු දහයකට වැඩි කාලයක් වහල් සේවයේ යෙදීමට සිදුවූ ආකාරය ගැනද අයෙක් කීවේය. ඉඩම් හිමියන් විසින් පොලීසිය මේ දරිද්‍රයන්ට එරෙහිව යොදාගන්නා ආකාරයත් තමන් විසින් යම් පැමිණිල්ලක් කළහොත් එය තමන්ටම විරුද්ධව යොදාගන්නා ආකාරයත් ගැන ඔවුහු නොයෙක් උදාහරණ දක්වමින් පැහැදිලි කළහ. මානව හිමිකම් ව්‍යාපාර මගින් ඇතිකරන ලද මැදිහත්වීම් මගින් තමන්ගේ විවිධ ප්‍රශ්න ගැන ඉහළ නිලධාරීන්ගේ අවධානය දිනාගැනීමට හැකි වූ බවත්, දිස්ත්‍රික් නඩුකාරයා පවා ඉතිහාසයේ මුල් වතාවට තමන් ඉන්නා කොණට පැමිණ ආහාර ප්‍රශ්නය ගැන විමසා ඉදිරි කාලයේදී දරුවන්ගේ මරණ වැළැක්වීමට පියරව ගන්නේ යැයි පොරොන්දු වූ බවත් ඔවුහු කීහ. එම දිස්ත්‍රික් නඩුකාරයා ඔවුන්ට කතා කරමින් තමන් දිල්ලියේ සිට පැමිණි අයෙක් බවත් ආහාර හිඟය නිසා දරුවන් මැරෙන තත්වයක් ඇති බවට කිසිදු අදහසක් තමන්ට නොතිබූ බවත් ඒ පිළිබඳ ව කණගාටු වන බවත් අනාගතයේදී මෙවැනි ප්‍රශ්නවලදී වහා ක්‍රියාත්මක වන බවත් කීවේලු. කෙසේ වුවත් මේ සිදුවීම් තුළින් මේ කණ්ඩායම තුළ දැඩි උනන්දුවක් හා ආත්ම ශක්තියක් ඇති වී තිබූ බව පෙනෙන්නට තිබිණි. ජන පාසල තුළදී සමහරු මුල්වරට තමනගේ නම ලිවීමට පුරුදු වූ සැටිත් එසේ ලිවීමෙන් පසු සතුටට පත්වූ සැටිත් දැකගත හැකි විය.


අම්බෙද්කාර්

පසුදින අපි 'කසියා' නමින් හඳුන්වන තණකොළ කපන්නන් හා සංගීතයේ යෙදෙන්නන් පදිංචිව සිටි කුඩා ගම්මානයකට ගියෙමු. මෙය මායාවතී නමැති ආණ්ඩුකාරවරිය විසින් ඔවුන් වෙත දායාද කරන ලද ඉඩමක් විය. එහි කුඩා ගෙවල් තනා ජීවත් වූ පවුල් ගණනාවක් විය. තමන් මුල් වතාවට මෙම ස්ථානයට පැමිණි පසු පොලිස් නිලධාරීන් එහි පැමිණ ගැහැනුන් සපයන ලෙස ඔවුන්ගෙන් ඉල්ලා සිටි හැටිත්, එය ප්‍රතික්ෂේප කිරීම නිසා එහි සිටි සියල්ලන්ටම ඉතා දරුණු ලෙස පහරදුන් සැටිත් මෙම ගම්මානයේ ජීවත් වන කසියාවරු තමන්ගේ ඉතිහාසයේ කොටසක් ලෙස කියති. මෙසේ පහර කෑ අය අතර ඉන්දියාවේ නැටුම් කලාකරුවෙකු ලෙස විශාල කීර්තියක් ලබා සිටි අයෙකු ද විය. ඔහු ද එම කුලයට අයත් දරිද්‍රයෙකි. ඔහු ඉන්දියාවේ ජනාධිපති හා වෙනත් ඉහළ අය ඉදිරියේද නැටුම් නටා ඇති අතර රජීව්

ගාන්ධි අගමැතිවරයා විසින් දෙන ලද භෝජන සංග්‍රහයකටද සහභාගී වී ඇත. එහිදී ලැබුණු සහතිකයක් දැනුත් ඇත. එහෙත් මෙම සුප්‍රසිද්ධ නැට්ටුවාට පවා බරපතළ ලෙස තුවාළ සිදුකරමින් පහර දෙන ලදී. එහි ප්‍රතිඵලයක් වශයෙන් ඔහුට දැන් පෙර කරගෙන ගිය නැටුම් කලාවේ යෙදීමට බැරි ය. මෙම පහරදීම නිසා ඇතිවූ කරදරකාරී කාලය තුළ කසියාවරුන් අතර අධෛර්යමත් කමක් ඇති විය. එහි ප්‍රතිඵලය වූයේ ඔවුන්ගේ කුඩා දරුවන් දහඅට දෙනෙක් ආහාර නැති කමින් මිය යාම ය.

අප එම ගම්මානයට ගියේ මෙම දරුවන් දහඅට දෙනා සිහිපත් කිරීම සඳහා ගොඩනැගුණු ස්මාරකයක් විවෘත කිරීම සඳහා ය. ආචාර්ය ලෙනින් සහ තවත් අය දරුවන්ගේ මරණ දැනගැනීමෙන් පසු එම සිද්ධි පිළිබඳව විශාල ආන්දෝලනයක් ඇති වූ අතර එහි ප්‍රතිඵලයක් වශයෙන් ප්‍රාදේශීය බලධරයන්ගේ අවධානය මේ ගම වෙත යොමු විය. විවිධ ආධාර ද එම ගමට ලැබිණි. අනාගතයේදී හදිසියකදී පාවිච්චි කළ හැකි වන පරිදි කුඩා සහල් ගබඩාවක් ද මෙම ගම්මානය තුළ ඉදි කෙරිණි. ඉහත සඳහන් කළ නැට්ටුවා තවත් කීප දෙනෙක් සමග බෙර ගසමින් ගෙවල් ගානේ ගොස් ආහාර එකතු කිරීමක් ද පටන් ගත්තේය. කසියාවරුන්ගේ බෙරය සාදනු ලබන්නේ මැටියෙනි. මෙසේ දරිද්‍රයන් පිළිබඳ උනන්දුවක් දක්වන කණ්ඩායම් සමග සම්බන්ධ වූ කසියාවරු තමන්ගේ අනාගත සුබසිද්ධිය සඳහා වැඩි උනන්දුවකින් කටයුතු කිරීමට පටන් ගත්හ. මිය ගිය දරුවන් වෙනුවෙන් ස්මාරකයක් ගොඩනැගීමේ අදහස කරා ඔවුන් පැමිණියේ ඒ ආකාරයෙනි. එම ස්මාරකයට පරමාදර්ශ ලබාගෙන තිබුණේ ශ්‍රී ලංකාවේ සීදුව රද්දොළුවේ ගොඩනගා ඇති අතුරුදන්වූවන් ස්මරණය කිරීමේ ස්මාරකය මගිනි. සිදුවූ මරණ පිළිබඳ මතකය අමතක නොකිරීමටත් යළි වැනි සිදුවීම් ඇතිවීම වළක්වාලන බව සනාථ කිරීමත් මෙම සිහිවටනය මගින් කෙරේ. සිහිවටනය විවෘත කිරීමට මහත් ප්‍රසිද්ධියක් පුවත්පත් මගින් ලබාදී තිබිණි. සෑම දිනකම එක මලක්වත් එම ස්මාරකය අබියස තැබීමට දෙමාපියෝ එකඟ වූහ. ස්මාරකය ඉදිකිරීමෙන් පසු එම ස්ථානයට ගිය එක් ගාන්ධිවාදියෙකු ස්මාරකය ඉදිරිපිට මල් විශාල වශයෙන් දමා තිබෙනවා දුටු බවට දන්වා තිබිණි.


ශ්‍රී ලංකාවේ සීදුව රද්දොළුවේ ගොඩනගා ඇති අතුරුදන්වූවන් ස්මරණය කිරීමේ ස්මාරකය

පසුදින අපි 'මහර්' නමැති උප කුලයට අයත් අය පදිංචි වූ කුඩා ප්‍රදේශයකට පැමිණියෙමු. මහර් යන උප කුලයට අයත් එක් කණ්ඩායමක් සපත්තු මැසීමේ යෙදෙන්නෝ ය. මෙම ගම්මානය ඔවුන්ට ලැබී තිබුණේ දැන් ටික කලකට පෙර ඉන්දියාවේ ඇති වූ ඉඩම් ප්‍රතිසංස්කරණය පිළිබඳ ආන්දෝලනය ඔස්සේ ය. එම ඉඩම් ප්‍රදේශයට අයිතිය, ආණ්ඩුව විසින් නිකුත් කරන ලද ඔප්පුවක් මගින් මෙම ගැමියනට ලැබී තිබිණි. එහෙත් එම ඉඩම් ඔවුන් කැමති සේ පාවිච්චි කිරීම වළක්වාළමින් එක් ඉඩම් හිමියෙක් නඩුවක් පවරා එම ස්ථානයේ කිසිම වැඩිදියුණුවක් ඇති නොකරන ලෙසට තහංචියක් පනවමින් තහනම් නියෝගයක් ලබාගෙන තිබේ. එහෙත් එම ඉඩම් හිමියාට මෙම ගම්මානය සම්බන්ධයෙන් කිසිම අයිතියක් නැත. ඉන්දියානු අධිකරණ ක්‍රමය තුළ ඇති විශාලම ව්‍යාජය නම් නඩු පමාව ය. හොඳින් හෝ නරකින් මෙවැනි තහනම් නියෝගයක් ලබාගත්පසු එය ඉවත් කර ගැනීමට විශාල උත්සාහයක් දැරිය යුතු අතර උසාවියෙන් නිසි ලෙස නියෝගයක් දීම

කල් පමා කරගත හැකිය. ඉඩම් හිමියනට බලවතුන් සමග සම්බන්ධකම් ඇත. දලිත්වරුන්ට එවැනි සම්බන්ධකම් නැත. එම නිසා අධිකරණයේදී ඔවුහු අවාසිදායක තත්වයකට මුහුණ දෙති. ඔවුන් මෙදින කතා කළේ මෙම තහනම් නියෝගය ඉවත් කර ගැනීම පිළිබඳ ව ය. මහර් කුලයට අයත් වූ මෙම ගැමියෝ ආර්ථික වශයෙන් මූසා හා කසියා යන කුලවල අයට වඩා අඩු දරිද්‍රතාවයකින් පෙළුණහ.

කොයි ලාංකිකයාත් ඉසිපතනය ගැන අසා ඇත. ඉසිපතනාරාමය පිළිබඳ අමරදේවයන්ගේ ගීතය ද ජනප්‍රිය ය. එහෙත් අශෝක රජතුමා විසින් ගොඩනගන ලද ඉසිපතන මුව උයන යනුවෙන් හැඳින්වෙන ස්ථානය කොතරම් සුවිශාල ද කොතරම් ඓතිහාසික ගාම්භීරත්වයකින් යුතුද යන්න පිළිබඳව වැටහෙන්නේ එය දැකීමෙන් පසුව ය. අපි ඉසිපතනාරාමයෙහි දෙදිනක්ම සැරිසැරුවෙමු. ඒ අසලම පිහිටි 1910 දී ගොඩනැගුණු ඉතා හොඳින් පරිපාලනය වන කෞතුකාගාරය බැලීමට ද අපට හැකි විය. ඉතිහාසයේ එක් කාලයක් පිළිබඳව ඉතා තියුණු අදහසක් මේවා දැකීමේදී ඇති වේ. බුදුන්ගේ කාලයෙන් අවුරුදු තුන්සියයකට පසු පාලනයට පැමිණි අශෝක, රාජ්‍යයක් තුළ සදාචාරයට හිමි තැන ඉතා ඈත කාලයකදීම අවබෝධ කර ගත් පාලකයෙකු බව සක්සුදක් සේ පෙනේ. "නීතියේ රෝදය" යනුවෙන් හැඳින්වුණු සදාචාරය මත පදනම් වූ නීතිමය මූලධර්ම තමන්ගේ පාලන ප්‍රදේශය තුළ ගැඹුරටම මුල් බැස්සවීමට පමණක් නොව තමන්ගේ බල ප්‍රදේශයෙන් එපිටටද ඒවා පතුරුවා හැරීමට ඔහු උනන්දු විය. අධ්‍යාපනය එක කුලයකට පමණක් හිමිකර ගැනීම නිසා ඉන්දීය සමාජය තුළ ඇතිවී තිබූ මහා ගැටළුව ඔහු විසඳන ලද්දේ එකල ප්‍රචලිතව පැවති බෞද්ධ දර්ශනය මුල් කොට ගත් සදාචාරාත්මක පදනමක් ගොඩනැගීමෙනි. එම මහා අභිමතාර්ථය විශාල වශයෙන් ලොවට කියා පාන අති විශාල ගොඩනැගිල්ලක නටඹුන් දැන් ඉතිරිව ඇත. කුල ක්‍රමය වෙනුවට සියලුම පුද්ගලයන්ට ගරු සැලකිලි කිරීම මත පදනම් වූ මානවවාදී සමාජයක අඩිතාලම පිළිබඳ සංකේතයක් ලෙස ඉසිපතනය පවතියි. මානව හිමිකම් පිළිබඳ දර්ශනය එතරම් ම පැළපදියම් වීමට තරම් සමාජ යථාර්ථයන් දියුණුව නොතිබුණු යුගයක අශෝක හා මෞර්ය රජවරුන් මානව හිතවාදී සංකල්පයක් මත රජය හා ජනතාව අතර ඇති සම්බන්ධය ගොඩනැගීමට දරන ලද මහා ප්‍රත්නය පසුකාලයකදී විශාල ගවේෂණයකට තුඩු දුන්නේය. බී.ආර්. අම්බෙත්කාර් වැනි නායකයන් ද රොමිලා තාපර් වැනි ප්‍රධාන පෙළේ ඉතිහාසඥයන් ද අශෝක යුගය පිළිබඳ ව හෙළිදරව් කිරීමක් ඔවුන්ගේ කෘතීන් ඔස්සේ කර තිබේ. දේශපාලන ක්ෂේත්‍රයේදී ආසියාවේ ඉතාම අභිමානනීය පාලකයා අශෝක යැයි පැවසීම අතිශයෝක්තියක නොවේ.



මූසාවරුන්ගේ ගම්මානයක ඇවිදින අතරදී අසල කුඹුරු වටේම දැකගත හැකි කහපාට මල්වලින් යුත් අඩි තුනක් පමණ උසැති පැළෑටි වර්ගයක් දුටුවෙමි. මෙම පැළෑටි මොනවාදැයි ඇසූ විට ඒවා 'අබ' පැළ බව දැන ගතිමි. අබ මල කහ පාට ය. කුඩා ය. එකම මල් පොකුරක් තුළ මල් ගණනාවක් ඇත. පුෂ්ප මංජරියකි. සියලුම කුඹුරු වටා වවා ඇති මෙම පැළෑටිය, අබ වගාව කෙතෙක් දුරට බරණැස් ප්‍රදේශය තුළ සිදුකෙරේද යන්න පෙන්නුම් කරයි. මේ ප්‍රදේශයේ විශාල ඉඩම් හිමියෝ සිටිති. කේරලය, බෙංගාලය වැනි ඉන්දියාවේ සමහර ප්‍රදේශවල ඇතිවූ මහා පරිමාණ ඉඩම් ප්‍රතිසංස්කරණ මේ ප්‍රදේශයේ සිදුවී නැත. මහා පරිමාණ වගාවේ කිසිදු හෝ වාසියක් දලිත් කුලවල අයට ලැබෙන්නේ නැත. මෙම පැළෑටිවලින් කිසිදු පලදාවක් ගැනීමට ද ඔවුන්ට අයිතියක් නැත. මහා පරිමාණ වගා සිදුවන වාතාවරණයකදීම ආහාර නැති කමින් දරුවන් මිය යාමද සිදුවේ.

අබමල් දැකීම නිසා යම් සතුටක් මා තුළ ඇති විය. අබ ඇටය පිළිබඳ උපමා කතාව ඉබේටම සිහියට නැගිණි. එම කථාවට උපහැරණය පැන නගින්නට ඇත්තේද ප්‍රදේශයේ සුලබව පවතින අබ වගාව නිසාම විය යුතුය. මරණය ඉදිරියේ සියල්ලන් ම සමාන වන සැටි අබ ඇටයේ කතාවෙන් කියැවිණි. විෂමතා මත පදනම් වූ සමාජ ක්‍රමයක් තුළ මෙම අබ ඇටයේ කතාව ඔස්සේ කියැවෙන්නේ කෙතරම් පරිණත වූ මානව ධර්මයක්ද? අබ ඇටයේ කතාවත් අශෝක මහා රජගේ දේශපාලන දැක්මත් අතර පවතින සම්බන්ධය මතකයේ තබාගැනීම සඳහා අබමල් සහිත පැළෑටිවල පින්තූර ගණනාවක් කැමරා කර ගතිමි.

# මනෝහරන්ගේ කතාව සහ ශ්‍රී ලංකාවේ විනිර්මුක්තියේ අර්බුදය

**ත්‍රිකුණාමලයේ ශිෂ්‍යයන් පස් දෙනාගේ සිද්ධිය යනුවෙන් ප්‍රකට වූ - අද දක්වා ද යුක්තිය ඉටු වී නැති මෙම සිද්ධිය ශ්‍රී ලංකාවේ විනිර්මුක්තියේ අර්බුදය පිළිබඳ පැහැදිලි උදාරහණයක් බව අන්තර්ජාතික නීති විශාරදයන්ගේ කොමිසම විසින් පළ කර තිබෙන වගවීම රහිත බලාධිකාරිය; ශ්‍රී ලංකාවේ විනිර්මුක්තිය පිළිබඳ අර්බුදය නමැති වාර්තාවේ මෙලෙස විස්තර වේ.**

---

2006 ජනවාරි 2 වැනිදා ත්‍රිකුණාමල වෙරළේදී ශිෂ්‍යයන් පස් දෙනෙක් ඝාතනයට ලක්වූ අතර තවත් දෙදෙනෙක් බරපතළ තුවාළ ලැබූහ. සන්ධ්‍යාවේ මුල්භාගයේදී ශිෂ්‍යයන් විවේක සුවයෙන් පසුවන අතර ඒ අසලින් ගමන් කළ කොල පැහැති රික්ෂෝ රථයකින් ඔවුන් වෙත ග්‍රෙනේඩයක් විසි කෙරිණි.[1] ශිෂ්‍යයන්ගෙන් බහුතරය පළාගිය අතර කෙසේ නමුත් අඩුම වශනේ තිදෙනෙක්වත් එහිදී තුවාළ ලැබූහ. තුවාළ නොලත් ශිෂ්‍යයන් දෙදෙනෙකු වූ මනෝහරන් රාඝිගර් සහ යෝගරාජා හේමචන්ද්‍රන් ත්‍රීරෝද රථ සහ වෙනත් වාහනවලින් තුවාළකරුවන් ව රෝහලට ගෙන යාමට අසාර්ථක උත්සාහයක යෙදෙමින් සිටියහ. ප්‍රදේශයේ නාවික හමුදා නිලධාරියා වහාම ප්‍රදේශයේ වූ මුරකපොලු වසා දැමුවේ වින්දිතයන්ගේ දෙමාපියන් ඔවුන්ගේ දරුවන් වෙත ළඟාවනු වැළැක්වීම සඳහා ය.[2] විනාඩි පහළොවකට පසුව විශේෂ කාර්ය බලකායේ යැයි විශ්වාස කෙරෙන දහදෙනෙක් හෝ පහළොස් දෙනෙක් අතර සංඛ්‍යාවකින් සමන්විත නිලඇඳුම් ඇඳගත් කණ්ඩායමක් සිද්ධිය වූ ස්ථානයට ජීප් රථයකින් පැමිණියහ. නිල ඇඳුම් ඇඳගත් නිලධාරීන් විසින් තුවාළලත් ශිෂ්‍යයන්ව වාහනයේ පිටුපසට දමා ඔවුන්ට රයිෆල් කඳන්වලින් පහරදීමට පටන් ගත්හ. ඉන්පසු ඔවුන්ව පාරට ඇද දමා සමීපයේ සිට වෙඩි තබමින් පස් දෙනෙකු මරා දැමූහ.[3] මිය ගිය ශිෂ්‍යයන් වූයේ, (1) ගජේන්ද්‍රන් ෂන්මුගරාජා, (2) රෝහන් ලෝහිතරාජා, (3) සිවනන්ද තංගතුරෙයි, (4) හේමචන්ද්‍රන් යෝගරාජා සහ (5) රාඝිගර් මනෝහරන් ය. මියගිය සහ තුවාළලත් අය ප්‍රාදේශීය රෝහලට ගෙන යන ලදී.[4] රාඝිගර් මනෝහරන් ගේ පියා වන වෛද්‍ය මනෝහරන් වෙඩි හඬ ඇසී රෝහලට ගියේය. වෙඩි තැබීමකින් හිසේ පිටුපස සිදුවූ විශාල තුවාළයක් ද සහිතව සිය පුත්‍රයාගේ මළ සිරුර ගිලන් මැස්සක තිබී ඔහු විසින් සොයාගැනිණි. වින්දියන්ගේ පවුල්වල අයට පොලීසිය ප්‍රකාශ කළේ, මළ සිරුරු ලබාගැනීමට අවශ්‍ය නම්, මියගිය වින්දිතයන් එල්ටීටීඊ සාමාජිකයන් බවට හඳුනාගැනෙන ප්‍රකාශ ඔවුන් විසින් අත්සන් කළ යුතු ව තිබෙන බවයි.[5]

---

[1] නව හිමිකම් පිළිබඳ සරසවි ආචාර්යවරු (යාපනය) ශ්‍රී ලංකාවල විශේෂ වාර්තාව අංක 24 - ත්‍රිකුණාමලයේ සිසුන් පස් දෙනෙක් පිළිබඳ සිද්ධිය. 2007 අප්‍රේල් 19

[2] *එම.*

[3] *එම.*

[4] විශ්වාසයේ විසි වසරක්ථ ශ්‍රී ලංකාවේ පරීක්ෂණ කොමිෂන් සභාල අන්තර්ජාතික කීර්තිමත් ස්වාධීන පුද්ගල කණ්ඩායමේ අවසන් වාර්තාව :2008 අප්‍රේල්. පිටු 16-21.

[5] මානව හිමිකම් පිළිබඳ සරසවි ආචාර්යවරු (යාපනය) ශ්‍රී ලංකාවල විශේෂ වාර්තාව අංක 24. ත්‍රිකුණාමලයේ සිසුන් පස් දෙනෙක් පිළිබඳ සිද්ධියී 2007 අප්‍රේල් 19. ප්‍රවේශය: http://uthr.org/SpecialReports/spreport24.htm

ප්‍රාදේශීය මානව හිමිකම් සංවිධානයකට අනුව විශේෂ කාර්ය බලකායේ සාමාජිකයන්, අණදෙන නිලධාරී සවාහිර් සහ විශේෂ කාර්ය බලකායේ අධිකාරී කපිල ජයසේකර, මෙම සිද්ධිය සැලසුම්කිරීම, සිදුකිරීම සහ ආවරණය කිරීම සඳහා වගකිව යුතු බව ප්‍රකට කරුණකි.[6] විමර්ශනය අවුල් සහගත කිරීම සහ කරුණු අපැහැදිලි කිරීම සඳහා ආරක්ෂක අංශ සහ පොලීසිය එක්ව කටයුතු කළහ. ත්‍රිකුණාමලයේ ජෝෂ්ඨ පොලිස් අධිකාරී සඳහන් කළේ වින්දිතයන් එල්ටීටීඊ සාමාජිකයන් වූ අතර ඔවුන් විසින් ආරක්ෂක අංශ වෙත ග්‍රෙනේඩ් ප්‍රහාරයක් එල්ල කිරීමට උත්සාහ කළ බවයි.[7] පොලිස් පරීක්ෂක සවාහිර්ගෙන් මේ පිළිබඳ සාක්සි ලබාගත් අතර ඔහු පැවසුවේ ඔහුට කිසිදු වෙඩි ශබ්දයක් නොඇසුණු බව හා සිද්ධිය වූ ස්ථානයේ තිබී පිපිරී නොගිය ග්‍රෙනේඩයක් සොයාගත් බවයි.[8] මූලික මහේස්ත්‍රාත් පරීක්ෂණයේදී රාජ්‍ය නිලධාරීන්ගේ සෙසු කිසිදු ප්‍රකාශයක ද වෙඩි ප්‍රහාරවලින් සිදුවූ තුවාල පිළිබඳ සඳහන් නොවූ අතර, වෙඩි හඬක් පවා ඇසුණු බවක් සඳහන් නොවිණි. ඒ වෙනුවට ශිෂ්‍යයන්ගේ මරණය සිදුවීමට හේතුව වශයෙන් ඔවුන් සඳහන් කළේ ග්‍රෙනේඩ් පිපිරීමයි.[9] මරණය සිදුවීමට හේතුව වෙඩි තැබීමකින් සිදුවූ තුවාළ බව සඳහන් අධිකරණ වෛද්‍ය නිලධාරියාගේ වාර්තාව මහජනයා වෙත මුදාහැරීමෙන් පසුව පමණක් පොලිස් සහ හමුදා නිලධාරීහු ඒ බව පිළිගත්හ.[10]

නඩුවේදී සාක්ෂි ලබානොදෙන ලෙස සිද්ධිය ඇසින් දුටු අයට තර්ජන සහ බලපෑම් සිදුකෙරිණි. 2006 ජනවාරි 10 වැනිදා වෛද්‍ය මනෝහරන් මහේස්ත්‍රාත් ඉදිරියේ සාක්ෂි ලබාදුන්නේය. එදිනම ඔහුට තර්ජනය කෙරුණු අතර ඔහුගේ නිවසට ගල් ප්‍රහාර එල්ල විය. ඊළඟ සතියේද වෛද්‍ය මනෝහරන් මහේස්ත්‍රාත් ඉදිරියේ සාක්ෂි ලබාදුන් අතර එවිට ද ඔහු තර්ජනයන් ට සහ උත්තර්ජනයන්ට ලක්විණි. 2006 ජූනි මහේස්ත්‍රාත් විභාගයේදී සාක්ෂි ලබාදීමට කැමැත්තෙන් සිටින්නෙකු වශයෙන් ඉතිරි වී සිටි එකම පුද්ගලයා වූයේ වෛද්‍ය මනෝහරන් පමණි. පොලිස් නිලධාරීන් දෙදෙනෙකු විසින් ඔහුගේ පුත්‍රයාට උත්තර්ජනය කිරීම සමග තර්ජන සහ උත්තර්ජන තවත් උග්‍ර විය. ඔහුට සහ ඔහුගේ පවුලට පවතින තර්ජන හේතුවෙන් වෛද්‍ය මනෝහරන් හට සිය වෛද්‍ය වෘත්තිය අත්හැර දැමීමට සිදුවූ අතර අවසානයේ ශ්‍රී ලංකාවෙන් පිටවීමට සිදුවිය.

2006 ජනවාරියේ පැවැත්වූ මහේස්ත්‍රාත් පරීක්ෂණය පිළිබඳ තමන් හට කිසිවිටෙක නොදැන්වී යැයි හේමචන්ද්‍රන් යෝගරාජා ගේ පියා වන පොන්නුතුරාජ් හේමචන්ද්‍රන් සඳහන් කළේය. රාජ්‍ය නිලධාරීන්ගෙන් එල්ල වූ තර්ජන හා උත්තර්ජනවලට ඔහු ද ලක්විය.

වධ හිංසාවට එරෙහි සම්මුතිය යටතේ සාක්ෂි දීමේදී හෝ කටඋත්තර ලබාදීමේදී පැන නගින සාක්ෂිකරුවන් හෝ පැමිණිලිකරුවන් උත්තර්ජනයට ලක්කිරීම් හෝ අවමන් සහගත සැලකිලිවලින් ආරක්ෂිත බව ට සහතික වීම ට සහ ඒ සඳහා අත්‍යවශ්‍ය පියවර ගැනීම ට ශ්‍රී ලංකාව බැඳී සිටියි. *සියලු පුද්ගලයන් බලහත්කාරයෙන් සිදුකරනු ලබන අතුරුදන්වීම්වලින් ආරක්ෂා කිරීම සඳහා වන*

---

[6] මානව හිමිකම් පිළිබඳ සරසවි ආචාර්යවරු (යාපනය) ශ්‍රී ලංකාවල විශේෂ වාර්තාව අංක 30ල සිසුන් පස්දෙනා සහ *CF* නඩුවල අවසන් නොවුණු කාර්යය- රැවටිලි කතා සඳහා ආමන්ත්‍රණය කිරීමට කාලයක් 2008 අප්‍රේල් 1*.* ප්‍රවේශය- http://uthr.org/SpecialReports/Spreport30.htm

[7] විශ්වාසයේ විසි වසරක්*.* ශ්‍රී ලංකාවේ පරීක්ෂණ කොමිෂන් සභා*.* අන්තර්ජාතික කීර්තිමත් ස්වාධීන පුද්ගල කණ්ඩායමේ අවසන් වාර්තාව :2008 අප්‍රේල්*.* පිටු 16-21*.*

[8] ත්‍රිකුණාමලේ සිසුන් පස් දෙනෙක් පිළිබඳ සිද්ධිය 2007 අප්‍රේල් 19ල මානව හිමිකම් සඳහා විශ්ව විද්‍යාල ආචාර්යවරු (යාපනය)*.* විශේෂ වාර්තාව අංක 24*.* 2007 අප්‍රේල් 19*.*

[9] *එම.*

[10] *එම.*

*අන්තර්ජාතික සම්මුතිය* යටතේ පැමිණිලිකරුවන් හා සාක්ෂිකරුවන් මෙන්ම ඥාතීන් ද වගඋත්තරකරුවන්ගේ නීතිඥයන් ද, සාක්ෂි දීම හෝ පැමිණිලි කිරීමේ ප්‍රතිඵලයක් ලෙස අවමන් සහගත සැලකීම් හෝ උත්තර්ජනයන්ගෙන් ආරක්ෂා කර ගැනීම සඳහා රාජ්‍යයන් සුදුසු පියවර ගත යුතුය.[11] තර්ජන හෝ උත්තර්ජනවලින් සාක්ෂිකරුවන් ආරක්ෂා කර ගැනීමට අපොහොසත් වීම, යුක්තිය අවහිර කරන අතර වින්දිතයන් සහ වින්දිතයන්ගේ පවුල් වල අය බලාත්මක ප්‍රතිකර්මයකට සහ මානව හිමිකම් උල්ලංඝනයන් සඳහා වන්දි පූරණයක් ලබාදීමේ රාජ්‍යය සතු වගකීම සමග පටහැණි වෙයි.

2006 වර්ෂයේදී *'ත්‍රිකුණාමලයේ සිසුන් පස් දෙනා පිළිබඳ සිද්ධිය'* විමර්ශනය කිරීම උදලාගම කොමිසමට පැවරිණි. බැඳීම් අතර බරපතළ පිළිගැටුමක් ප්‍රතිඵල කළ අභිචෝදන කාර්යයේදී සිදුව ඇති නීතිපතිවරයාගේ "අයෝග්‍ය සහ අවසර දිය නොහැකි භූමිකාව" කීර්තිමත් පුද්ගයන්ගේ අන්තර්ජාතික ස්වාධීන කණ්ඩායමේ දැඩි විවේචනයට ලක්විය.[12] මීට ඉහතදී මේ වන විටත් සාකච්ඡා කර ඇති පරිදි, කමිටුව ආරම්භ වී මද කාලයකින් එය මහත් ආන්දෝලනයකට ලක් වූ අතර කමිටුවේ සොයාගැනීම් කිසිවිටෙක මහජනයා වෙත හෙළි නොකෙරිණි.

ශිෂ්‍යයන්ගේ ඝාතන සම්බන්ධයෙන් වගකිවයුතු පුද්ගලයන් සඳහා කිසිදු විධිමත් අභිචෝදනාවක් සිදුනොකෙරිණි.

උගත් පාඩම් සහ සංහිඳියා කොමිසම *ත්‍රිකුණාමලයේ ශිෂ්‍යයන් පස්දෙනා* පිළිබඳ සිදුවීමට වරදකරුවන් පිළිබඳ විමර්ශනය කරන ලෙස නිර්දේශ කළේ, 'එවැනි ක්‍රියාමාර්ගයක් මගින් නීතියේ ආධිපත්‍යය ට ගරුකරන බවට ප්‍රබල සංඥාවක් සාක්ෂාත් වන බව' ද සඳහන් කරමිනි.[13]

# පියෙකුගේ කතාන්දරයක්



*(වෛද්‍ය මනෝහරන් වෙත පිදෙන කවියකි)*

මට පුතෙකු සිටියේය
මා ජාතියකට අයත් විය
ඒ ජාතිය මරා දැම්මේය
මපුතු.

''මැරෙන්න වෙඩි තියාපන්" යන්න නීතිය විය
කෙනෙකුගේ.
පුතෙකුට ආදරය කරන්න යන්න නීතිය විය
සොබාදහමේ.
කාගේ කවුද, කුමකින් කුමක්ද,
මම දැන් නොදන්නෙමි.

මගේ අසල්වැසියන්ගේ කන්වල යගුල් ය.
දෑස් පියැවී ඇත තදින්
ඒ, අමතක කරනු පිණිසය මපුතු
මට එසේ කියා ඇත.

මම උන්මත්තක වීමි
නොඑසේ නම් මගේ ජාතිය ද උන්මත්තක?
පුතෙකු වෙනුවෙන් ප්‍රේම කිරීම
පුතෙකු වෙනුවෙන් වැළපීම - ජාතික ලැජ්ජාවක්ද?

"මැරෙන්න වෙඩි තියාපන්" යන්න නීතිය විය
කෙනෙකුගේ.
පුතෙකුට ආදරය කරන්න යන්න නීතිය විය
සොබාදහමේ.
කාගේ කවුද කුමකින් කුමක්ද
මම දැන් නොදන්නෙමි.

\- *බැසිල් ප්‍රනාන්දු*

[11] ICIED හි 12 වගන්තිය
[12] *IIGEP* අවසන් වාර්තාව :2008 අප්‍රේල්
[13] LLRC වාර්තාවේ 5.163 ඡේදය